වාර්ෂික වාර්තාව 2018

வருடாந்த அறிக்கை 2018

Annual Report 2018



සීමාසහිත සීනෝර් පදනම

வரையறுக்கப்பட்ட சீநோர் நிறுவனம்

CeyNor Foundation Limited

No. 335, D. R. Wijewardhana Mawatha,
Colombo 10

(State Ministry of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbor Development, Multiday Fishing Activities and Fish Exports)

වාර්ෂික වාර්තාව

2018

සීමාසහිත සීනෝර් පදනම

නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

(විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය.)

අන්තර්ගතය

පිටු අංක

ආයතනික තොරතුරු 3-5

දැක්ම, මෙහෙවර සහ අරමුණු 6

හැඳින්වීම 7

සභාපතිතුමාගේ සමාලෝචනය 8-9

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 10-11

2018 වර්ෂය තුල ලබාගත් ජයග්‍රහණ 12-15

2018 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය 16

නිෂ්පාදන වර්ගීකරණ 17-21

අනාගත සැලසුම් 22-23

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව 24-35

මූල්‍ය ප්‍රකාශන 36-62

ආයතනික තොරතුරු

- **සමාගමේ නම සහ ලිපිනය**

  සීමාසහිත සිනෝර් පදනම
  නො: 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

- **නෛතික පසුබිම**

  1982 අංක 17 දරණ සමාගම් පනතට හා අනතුරුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කල සමාගමකි.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

එම්. එච්. කේ. පරණවිතාන මයා	-	සභාපති
නිහාල් චන්ද්‍රසිරි මයා	-	කළමනාකාර අධ්‍යක්ෂ
කේ. ඒ. එස්. එස්. කේ. පෙරේරා මයා	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
ඩී. ඒ. ඩී. උපුල් චන්දන මයා	-	අධ්‍යක්ෂ
එච්. විරාජ් ගජේන්ද්‍ර ද සිල්වා	-	අධ්‍යක්ෂ

- **සමාගම් ලේකම්**

  ආනන්ද සිරිසේන සහ සමාගම,
  නො. 70/2/3B/ දෙවන මහල,
  වයි. එම්. බී. ඒ. ගොඩනැගිල්ල,
  ඩී. එස්. සේනානායක මාවත,
  බොරැල්ල.

- **විගණකවරු**

  විගණකාධිපති දෙපාර්තමේන්තුව,
  අංක 306/72, පොල්දූව පාර,
  බත්තරමුල්ල.

- **බැංකුකරුවෝ**

  ලංකා බැංකුව,
  ආයතනික ශාඛාව,
  කොළඹ 01.

  හැටන් නැෂනල් බැංකුව,
  නගර ශාඛාව,
  කොළඹ 01.

  මහජන බැංකුව,
  රැජින ශාඛාව,
  කොළඹ 10.

- **බෝට්ටු යාත්‍රාංගන**

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය,
නො. 25, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය, (කැළණි ගග අසබඩ)
නො. 135, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය,
කොළඹ 15.

සීනෝර් බෝට්ටු යාත්‍රාංගනය,
කරෙනගර්.

- **ISO තත්ත්ව සහතිකය**

2009 වර්ෂයේ සිට බෝට්ටු නිෂ්පාදනය පිළබඳ ISO 9001 – 2015 තත්ත්ව සහතිකය පිරිනමන ලද රාජ්‍ය සමාගමකි.

- **හවුල් ව්‍යාපාර**

සීනෝර් ඔරියන්ට් මුහුදු කෑම අවන්හල, නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.	-	සීමාසහිත සීනෝර් පදනම සහ සීනෝර් ඔරියන්ට් පර්ල් සමාගම සමග අවුරුදු 20 කට අදාලව පැවැති හවුල් ගිවිසුම 2018.07.04 වන දිනෙන් අවසන් විය. ගිවිසුම්කාර පාර්ශවය විසින් Writ 226/2018 අංක ඇතිව අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව මේ වන විට විභාග වෙමින් පවතී.
මත්තුමගල කාර්මික වැඩහල, නො. 31 A, ගල් උඩුපිට පාර, මත්තුමගල.	-	සීමාසහිත සීනෝර් පදනම සහ ෆ්‍රොන්ටියර් ඔටෝ මෝටිව් පුද්ගලික සමාගම සමග 2006 අගෝස්තු මස 17 වන දින සිට 2021 අගෝස්තු මස 16 වන දින දක්වා අවුරුදු 15 ක කාල සීමාවක් සඳහා ව්‍යාපාරයෙහි ලාභ බෙදා ගැනීමේ සහ මාසිකව කුලියක් ලබා දීමේ පදනම මත අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ.

සීනෝර් පදනම සතු වර්ග අඩි 25,000 කින් යුත් ගබඩා සංකීර්ණය, නො. 25, හැඳල තොටුපොල පාර, මට්ටක්කුලිය, කොළඹ 15.	-	සීමාසහිත සීනෝර් පදනම අන්වරලි ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම සමග 2017 පෙබරවාරි මස 08 වන දින සිට 2022 පෙබරවාරි මස 08 වන දින දක්වා අවුරුදු 05 ක කාල සීමාවකට මාසික කුලී පදනම මත ලබා දී ඇත.

දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  ශ්‍රී ලංකාව තුළ ධීවර යාත්‍රා සහ විනෝද යාත්‍රා නිෂ්පාදනයේ මෙන්ම අනෙකුත් ෆයිබර්ග්ලාස් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමුඛයා පවට පත් වීම හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා නිෂ්පාදකයෙකු බවට පත් වීම.

- **මෙහෙවර**

  තරඟකාරී මිල ගණන් යටතේ ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න සපයන කාර්යක්ෂම හා ඵළදායී ආයතනයක් ලෙස කටයුතු කිරීම.

- **අරමුණු**

  - ෆයිබර්ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරුවෙකු බවට පත්වීම.
  - ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත්වීම.
  - විදේශ රටවල් තුළ ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු බවට පත්වීම.
  - විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නෙකු වීම.
  - ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ වඩාත් ඵළදායී අනුග්‍රාහකයෙකු වීම.

හැඳින්වීම

ශ්‍රී ලාංකීය ධීවර ප්‍රජාවගේ අධ්‍යාපන සහ සුභ සාධක කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් 1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක ආධාර මත ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සීනෝර් සංවර්ධන පදනම ආරම්භ කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීනෝර් සංවර්ධන පදනම **"සීමාසහිත සීනෝර් පදනම"** ලෙස සංස්ථාගත කර ඇත. ආරම්භයේ සිට කාලයාගේ ඇවෑමෙන් මෙම සංවිධාන ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම් පහත පරිදි දක්වා ඇත.

1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන නෝර්වේ ගොඩිටෙම්ප්ලර් උන්ග්ඩෝම්ස් පෙර්බන්ඩ් වෙතින් ලත් ආධාර ප්‍රයෝජනයට ගනිමින් සීනෝර් සංවර්ධන පදනම පිහිටුවා එහි කටයුතු ඇරඹීය.

1971 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ඇපයෙන් සීමිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කොට සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම යන නමින් හැඳින්වීය.

1985 ශ්‍රී ලංකා රජය විසින් 1971 අංක 35 දරණ වෙළඳ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරාගත් අතර රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම නමින් හැඳින්වීය.

1990 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ක්‍රියාත්මක වීමෙන් රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම අහෝසි වී එහි අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1990.01.17 වන දින සීමාසහිත සීනෝර් පදනම සංස්ථාගත කරනු ලැබ ඇත.

මෙම නව සමාගමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය (රු. 40,000,000/-) භාණ්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර ඇත.

2011 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සීමාසහිත සීනෝර් පදනම යටතේ පැවැති ලුණුවිල සහ වීරවිල මාළුදැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යාම සඳහා සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දී ඇති අතර නෝර්ත් සී ආයතනය යටතේ පැවැති යුද්ධයෙන් විනාශ වූ කරෛනගර් බෝට්ටු යාත්‍රාංගනය සීනෝර් පදනම වෙත පවරා දී ඇත.

2013 දික්ඕවිට ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව සියලුම ධීවර සහ විනෝද යාත්‍රා නිෂ්පාදනය සඳහා මට්ටක්කුලිය යාත්‍රාංගනය වැඩි දියුණු කිරීම.

සභාපතිතුමාගේ සමාලෝචනය

සීමාසහිත සීනෝර් පදනමේ අභිවෘද්ධිය සඳහා අප විසින් 2017 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහ එමගින් අත්පත් කරගත් ප්‍රතිඵල මූලික කොටගෙන අප විසින් සිදු කරන ලද ධීවර යාත්‍රා සහ ඒ ආශ්‍රිත උපකරණ නිෂ්පාදනය 2018 වර්ෂය සඳහාද එලෙසම පවත්වාගෙන යමින් සාර්ථකව නිම කරන ලද 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ වාර්ෂික වාර්තාව සීනෝර් පදනමේ සභාපතිවරයා ලෙස ඉතාමත් සංතෝෂයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරමි.

ධීවර ජන සමාජය මුහුණදෙන ප්‍රධාන ගැටළුවක් වන, ඔවුන් විසින් නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්නෙහි පසු අස්වනු නාස්තිය අවම කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද සියළු නවීන උපාංග වලින් සමන්විත බහුදින ධීවර යාත්‍රා තුනක නිෂ්පාදන කටයුතු සාර්ථකව නිම කරමින් ධීවරයන් වෙත ලබා දීමට 2018 වර්ෂය තුලදී හැකියාව ලැබුණු බව දැනුම්දීමට කැමැත්තෙමි. මීට අමතරව ඊට අදාලව අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ප්‍රතිලාභීන්ගේ කැමැත්ත මත ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තෝරා ගන්නා ලද පෞද්ගලික යාත්‍රාංගන වල නිෂ්පාදනය කළ යාත්‍රා 03 ක්ද, සීනෝර් ආයතනයේ අධීක්ෂණය යටතේ සිදු කර ධීවර ජනතාව අතට පත් කිරීමට ද 2018 වර්ෂයේදී හැකියාව ලැබුණි.

සංවර්ධන අරමුණු දකුණට පමණක් සීමා නොවී උතුරු ප්‍රදේශයේ ධීවර ජනතාවට පැවැති යාත්‍රාංගනයක අවශ්‍යතාවයට පිළියමක් ලෙස සීමාසහිත සීනෝර් සමාගමේ තවත් එක් යාත්‍රාංගනයක් යාත්‍රාංගන උපකරණ ධීවර අමාත්‍යාංශයේ රු. මි. 460 ක ආයෝජන සහිත ව්‍යාපෘතියක් කරෛනගර් ප්‍රදේශයේ ඉදිකර 2018 වර්ෂයේදී එය සීනෝර් ආයතනයට පැවරීම සිදු කරන ලදී. එමගින් ඉදිරියේදී උතුරු ප්‍රදේශයේ ධීවර ජනතාවගේ අවශ්‍යතාව මත යාත්‍රා නිෂ්පාදනයට අවකාශ සැලැස්වීමට සීනෝර් ආයතනය මගින් බලාපොරොත්තු වේ.

යහපාලන අරමුණු අනුව යමින් සීනෝර් සීෆුඩ් අවන්හල පිහිටි භූමිය පෞද්ගලික ආයෝජකයෙකුට (වසර 20 ක් පුරා) ලබා දී තිබූ අතර වඩාත් විනිවිද ක්‍රමවේදයන් ඔස්සේ ආයෝජකයන් කැඳවීමට අවශ්‍ය කටයුතු යොදමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නැවත ඉදිරිපත් කරන ලදී.

2018 වර්ෂයේ පිළිවෙලින් රු. මි. 222.5, රු. මි. 25, රු. මි. 15 යනාදී ආයතනික නිෂ්පාදන, අනෙකුත් මෙහෙයුම් සහ භාණ්ඩ මිලදී ගෙන විකිණීම හරහා රු. මි. 263.9 ක දළ ආදායමක් ලැබුවද වර්ෂ අවසානයේදී අපේක්ෂිත අරමුණු වූ ලාභ ඉපයීමක් සිදු කර ගැනීමට නොහැකි විය. ඒ අනුව 2018 වසරේ බදු පසු ශුද්ධ අලාභය රු. මි. 54.68 කි.

මෙසේ අලාභ ලැබුවද ධීවර ජනතාවට ඉහළ සේවයක් ඉටු කරමින් පහතින් දැක්වෙන නිෂ්පාදන ඔස්සේ ධීවර ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් සීනෝර් ආයතනය කටයුතු කර ඇත.

- ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය මගින් මුලතිව් ප්‍රදේශයේ ධීවරයින්හට ලබා දෙන ලද අඩි 19 1/2 බෝට්ටු 150 හි නිෂ්පාදන කටයුතු සාර්ථකව නිම කර ඔවුන් වෙත ලබා දෙන ලදී.
- මොරිෂස් රාජ්‍යයේ ගැණුම්කරුවෙකු සඳහා අඩි 55 ක් දිගැති බහුදින ධීවර යාත්‍රාවක් නිෂ්පාදනය කර ලබා දීම.

- සංචාරක ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් තල්මසුන් නැරඹීමේ යාත්‍රා 02 ක් මිරිස්ස ප්‍රදේශයේ ගැණුම්කරුවන් සඳහා නිෂ්පාදනය කර ලබා දීම.

තවද 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ සඳහන් කොට ඇති අපගේ පද්ධති හා පාලන වල පවතින දුර්වලතා නිවැරදි කිරීමට 2018 වර්ෂය තුලදී කටයුතු කර ඇති බවද දන්වා සිටිමි.

2018 වර්ෂය තුලදී අප සමාගමෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මග පෙන්වූ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය විජිත් විජිතමුණි සොයිසා මැතිතුමාට සහ එම අමාත්‍යාශයේ ලේකම්තුමාටත්, අමාත්‍යාංශයේ සේවක මඩුල්ලටත් මාගේ ස්තුතිය පල කර සිටිමි. තවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පිරිනමමි. අපහට ලබා දෙන ලද සියලු කාර්යයන් 2018 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීමට නොමද සහායක් ලබා දුන් සීනෝර් පදනමෙහි කළමනාකාර අධ්‍යක්ෂක ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයටත්, සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලයට ද මාගේ ස්තුතිය පුද කරමි.

.....

ඒ. පී. රාජ් චන්ද්‍රලාල්
ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)
වර්තමාන සභාපති
සීමාසහිත සීනෝර් ෆදනම

අත්සන් කළේ:-
එම්. එච්. කේ. පරණවිතාන
හිටපු සභාපති
සීමාසහිත සීනෝර් පදනම

2018 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

01. විගණනය කරන ලද ගිණුම්

2018 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇත.

02. මූල්‍ය ප්‍රතිඵල

වර්ෂයේ ශුද්ධ ලාභය / (අලාභය) පිටු අංක 42 හි සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

03. පවත්නා තත්ත්වය

සමාගමේ පවත්නා තත්ත්වය පිටු අංක 43 හි දක්වා ඇත.

04. මූලික මෙහෙයුම් කාර්යයන්

2018 වර්ෂයෙහි සමාගමේ මූලික මෙහෙයුම් කාර්යයන් පහත පරිදි දැක්වේ.

- සියලු පහසුකම් වලින් සමන්විත ෆයිබර්ග්ලාස් බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනය.
- ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය මාළු පෙට්ටි, අලෙවි කුටි සහ ආරක්ෂක කුටි නිෂ්පාදනය කිරීම.
- මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය ඔරු සහ කොල්ලෑ නිෂ්පාදනය කිරීම.
- ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය මාළු දැල් සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම සහ විකිණීම් කටයුතු සිදු කිරීම.
- සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය විනෝද යාත්‍රා සහ තල්මසුන් නැරඹීමේ යාත්‍රා නිෂ්පාදනය කිරීම.

05. ලාභාංශ

2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභාංශ ප්‍රකාශ කර නොමැත.

06. සමාගම සමග යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2018 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂකවරුන් සමග කොන්ත්‍රාත් සබැඳියාවක් නොමැත.

07. සමාගමේ කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව

2018 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂකවරයෙකු සතු වූ කොටස් නොමැත.

08. ප්‍රමාණාත්මක කොටස් හිමිකම

ශේෂපත්‍ර දිනට සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් 100% ක් මහාභාණ්ඩාගාරයේ ලේකම් සතුව පවතී.

09. පුණ්‍යායතනයන්ට ආධාර කිරීම්

2018 වර්ෂය තුළදී සමාගම විසින් කිසිම පුණ්‍යාධාර ආයතනයකට හෝ දේශපාලන කරුණු සඳහා කිසිම දායකත්වයක් සපයා නොමැත.

10. දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ වල වෙනස්වීම්

පිටු අංක 57 හි, උපලේඛනයේ දක්වා ඇති පරිදි දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ සංචලනය වී ඇත.

11. බැංකු පහසුකම්

වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා සමාගම සතු බැංකු පහසුකම් අවශ්‍යතා අඛණ්ඩව සපයන සමාගමේ බැංකුකරුවන් ආරක්ෂිත ඇපකර මත තවදුරටත් මෙම පහසුකම කරන බව විශ්වාස කර ඇත.

12. විගණකවරුන් පත් කිරීම

19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සීමාසහිත සීනෝර් පදනම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයට යටත් වේ.

13. මානව සම්පත

2018 දෙසැම්බර් 31 වන දිනට සීමාසහිත සීනෝර් පදනමෙහි මුළු සේවක මඩුල්ල පහත පරිදි වේ.

01. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	-	01
02. කළමනාකරුවන්	-	04
03. කණිෂ්ඨ කළමනාකරුවන්	-	01
04. කළමනාකාර සහකාරවරුන්	-	28
05. ප්‍රථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවකයින්	-	45

14. 2018 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

එම්. එච්. කේ. පරණවිතාන මයා	-	සභාපති
නිහාල් චන්ද්‍රසිරි මයා	-	කළමනාකාර අධ්‍යක්ෂ
කේ. ඒ. එස්. එස්. කේ. පෙරේරා මයා	-	අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත)
ඩී. ඒ. ඩී. උපුල් චන්දන මයා	-	අධ්‍යක්ෂ
එච්. විරාජ් ගජේන්ද්‍ර ද සිල්වා	-	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

.....
ඒ. පී. රාජ් චන්ද්‍රලාල්
ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)
වර්තමාන සභාපති
සීමාසහිත සීනෝර් පදනම


අත්සන් කළේ:-
එම්. එච්. කේ. පරණවිතාන
හිටපු සභාපති
සීමාසහිත සීනෝර් පදනම

.....
Director, Ananda Sirisena & Co. (Pvt.) Ltd. (PV63581)
....Registered Secretaries.SEC/(2)2008/214
ආනන්ද සිරිසේන සමාගම
සමාගමේ ලේකම්

2018 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණ

සීමාසහිත සීනෝර් පදනම විසින් 2018 වර්ෂය තුළදී සමාගම පිහිටුවීමේ අරමුණු මත පමණක් පදනම් කර සියලු ව්‍යාපාර කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව දේශීය කරදිය සහ මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය කරන ෆයිබර්ග්ලාස් ධීවර යාත්‍රා, බෝට්ටු, ඔරු, කොල්ලෑ සහ අනෙකුත් ෆයිබර්ග්ලාස් ආශ්‍රිත ධීවර ආම්පන්න නිෂ්පාදනය සහ අලෙවිය මගින් ලබාගත් ආදායමට අමතරව සීමාසහිත සීනෝර් පදනම සමග කළමනාකරණ ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන්නා වූ ව්‍යාපෘති මගින් ද අමතර ආදායමක් උපයා ගැනීමට සමත්ව තිබුණි.

ඒ අනුව 2018 වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතු සමාගම පිහිටුවීමෙහි මූලික අරමුණ වන ෆයිබර්ග්ලාස් ධීවර යාත්‍රා, විනෝද යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න නිෂ්පාදනයට පමණක් සීමා කිරීම මගින් ධීවර ක්ෂේත්‍රයෙහි උන්නතියට දායකවන ඉහළ ගුණාත්මක භාවයකින් යුතු ධීවර යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න පමණක් නිෂ්පාදනය කිරීමට කටයුතු සිදු කර ඇත.





පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා සීනෝර් පදනම විසින් නිෂ්පාදනය කරනු ලබන අඩි 59.5 ක් දිගැති නවීන තාක්ෂණයෙන් සමන්විත ධීවර යාත්‍රා සහනදායී පදනම යටතේ දේශීය ධීවර ජනතාව වෙත නිෂ්පාදනය කර ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 50% සහනාධාර ක්‍රමය මත නිෂ්පාදනය කරන ලද නවීන අංගෝපාංග වලින් සමන්විත අඩි 59.5 ක් දිගැති ධීවර යාත්‍රා තුනක් දියඹට දියත් කිරීම සහ එම යාත්‍රා තුනෙහි හිමිකරුවන්හට යාත්‍රාවේ යතුරු භාර දීම මෙම වර්ෂය තුළදී සිදු කරන ලදී. Deep V Bottom Chine Hull ක්‍රමයට අනුව නිෂ්පාදනය කර ඇති මෙම යාත්‍රාවේ Fish Hold පරිමාණය 40 Cu.m ක් ද, ඉන්ධන ධාරිතාවය ලීටර් 14,000 ක් ද, පිරිසිදු ජල ධාරිතාවය ලීටර් 4500 ක් ද, යාත්‍රාවේ වේගය පැයට නොට් 10 ක් පමණ වේ. තවද යාත්‍රාවේ එකවර මිනිසුන් 8 දෙනෙකුට ගමන් කල හැකි අතර එකවර මාළු ටොන් 20 ත් 25 ත් අතර ප්‍රමාණයක් ගොඩබිමට රැගෙන ඒමට ඇති සුවිශේෂී හැකියාවක් සහිතව මෙම යාත්‍රා නිෂ්පාදනය කර ඇත.





එම ව්‍යාපෘතියට සමගාමීව නව තාක්ෂණය හඳුන්වාදීමේවැය ශීර්ෂය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද අඩි 55 ට වඩා විශාල බෝට්ටු නිෂ්පාදනය සඳහා ප්‍රතිලාභීන්ගේ කැමැත්තට අනුව ඔවුන් විසින් තෝරා ගන්නා ලද යාත්‍රාංගන දෙකට ප්‍රදානය කරන ලද බෝට්ටු තුනක නිෂ්පාදන කටයුතු අධීක්ෂණය තුළින්ද සමාගමෙහි අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට 2018 වර්ෂය තුළදී ද හැකියාව ලැබී ඇත.

දිගු කාලීන යුද්ධයකින් පසුව උතුරු පළාතේ දුර්වල වී තිබූ ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මගින් මුලතිව් ප්‍රදේශයේ ධීවරයින්හට ලබා දෙන ලද අඩි 19.5 ක් දිගැති ධීවර බෝට්ටු 150 ක නිෂ්පාදන කටයුතු සාර්ථකව නිම කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

විදේශීය වෙළඳපොලට අවශ්‍ය කරන අඩි 55 ක් දිගැති ඉදිරි කැබිනය සහිත ධීවර යාත්‍රා නිෂ්පාදනය කර ලබා දීම මගින්ද සමාගමෙහි අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීමට සමත්වී ඇත. ඒ අනුව මොරිෂස් රාජ්‍යයේ ගැනුම්කරුවෙකු සඳහා නිෂ්පාදනය කරන ලද අඩි 55 ක් දිගැති ධීවර යාත්‍රාව ප්‍රතිලාභියා වෙත ලබා දුන් අතර මේ මගින් විදේශීය ඇණවුම් ප්‍රවර්ධනය කිරීමද සමාගමේ අරමුණ විය.

2018 වර්ෂය තුළදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අපගේ සහෝදර ආයතන මගින් අපගේ නිෂ්පාදනයන්හි ප්‍රමිතිය හා විශ්වාසය මත පදනම්ව අප වෙත ලබා දෙන ලද ඇණවුම් වලට අදාලව ඔරු, කොල්ලෑ සහ මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කොට ඔවුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.







ධීවර කර්මාන්තයට අවශ්‍ය යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න නිෂ්පාදනයට අමතරව අප සමාගම විසින් සංචාරක කර්මාන්තය තුළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතින සීනෝර් පදනම විසින් පමණක් නිෂ්පාදනය කරනු ලබන අඩි 50 ක් දිගැති මගීන් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් යාත්‍රා කළ හැකි ෂෂිමි වර්ගයේ තල්මසුන් නැරඹීමේ යාත්‍රා දෙකක නිෂ්පාදන කටයුතු 2018 වර්ෂය තුළ සාර්ථකව නිම කර මිරිස්ස ප්‍රදේශයේ යාත්‍රා හිමිකරුවන් වෙත භාර දීමට කටයුතු කර ඇත.





ඉහත සඳහන් කරුණු වලට අමතරව 2018 වර්ෂය තුළ දී අප සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සියලු භාණ්ඩ වල සවිස්තරාත්මක විස්තරයක් පහත වගුවේ දක්වා ඇත.

අංකය	නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය
1.	සෂිමි යාත්‍රාව	04
2.	අඩි 19 ½ පතුල පැතලි ඔරු	20
3.	ඔරු	375
4.	ෆයිබර්ග්ලාස් හැවරි ජා	70
5.	ෆයිබර්ග්ලාස් පාවෙන පාලම/ මගී පාලම	01
6.	කොල්ලෑ	435
7.	හබල	02
8.	පැඩ්ල් බෝට්ටු	01
9.	බහුදින යාත්‍රා (අඩි 55 සහ අඩි 59.5)	02
10.	ෆයිබර්ග්ලාස් මාළු පෙට්ටි	40
11.	අයිස් පෙට්ටි	21
12.	ජීවිතාරක්ෂක වළලු	17
13.	තෙප්පම්	01
14.	ලයිව් ටෑන්ක්ස්	02
එකතුව		**991**

2018 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය

සීමාසහිත සීනෝර් පදනම 2018 මුදල් වර්ෂය අවසානය දක්වා රුපියල් මිලියන 54 ක බදු පසු ලාභයක් උපයමින් ඉතා සාර්ථකව කළමනාකරණය කර ඇත. 2018 වර්ෂයේදී මෙම ලාභය අත්පත් කර ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද ඇණවුම් මෙන්ම අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මගින් ලබා දෙන ලද ඇණවුම් බෙහෙවින් දායක වී ඇත.

අනු අංකය	විස්තරය	පිරිවැටුම
01	සමාගමේ නිෂ්පාදන මගින් ලැබූ ආදායම	රු. 222,591,312.57
02	අනෙකුත් මෙහෙයුම් ආදායම	රු. 25,372,520.12
03	මිලදී ගැනීම් සහ විකිණීම මගින් ලැබූ ආදායම	රු. 15,949,186.75
මුළු ආදායම		**රු. 263,913,019.44**

වගුව 4

පසුගිය වසර 3 තුල කැපී පෙනෙන මූල්‍ය තත්ත්වයන් 321,674,585.98

විස්තරය	2016	2017	2018
මුළු ආදායම	267.09	1060.63	263.91
දළ ලාභය (අලාභය)	73.83	170.56	19.35
ශුද්ධ ලාභය (අලාභය) බදු වලට පසු	0.70	89.35	(54.68)
කොටසක ඉපයීම	0.27	22.34	(13.67)
ස්ථාවර වත්කම් (ශුද්ධ පොත් අගය)	309.50	346.42	321.67
ස්ථාවර තැන්පත්	1.30	1.30	12.00
ජංගම වත්කම්	186.58	445.25	205.4
ජංගම වගකීම්	225.93	431.48	117.6
ජංගම නොවන වගකීම්	46.93	41.25	35.05
කොටස් ප්‍රාග්ධනය	40.00	40.00	40.00
අනෙකුත් සංචිත සමග ප්‍රාග්ධනය	231.55	320.90	349.6

නිෂ්පාදන වර්ගීකරණ

❖ අඩි **59.5** ක් දිගැති බහුදින ධීවර යාත්‍රාව

- Length 18m
- Beam 5.20m
- Draft 1.60m
- Fuel 14000l
- Water 4500l
- Fish hold capacity 45.0cu.m
- Engine capacity 410 hp



❖ අඩි **55** ක් දිගැති බහුදින ධීවර යාත්‍රාව

- Length 16.764m
- Beam 5.03m
- Draft 1.8m - 2.05m
- Fish hold capacity 29m3 - 35m3
- Fuel 10,000- 14000l
- Water 5,000-6000l
- Speed 9kmph
- Engine capacity 320 -410 hp



❖ **50** ක් දිගැති මගී යාත්‍රාව/ සෂිමී යාත්‍රාව/ තල්මසුන් නරඹන යාත්‍රාව

- Length 15.24m
- Beam 5.30m
- Draft 1.05m
- Main Hull Beam 2.30m
- Fuel 2,400l - 3,000l
- Water 1000 -1500l
- Seating Capacity 5.30m
- Speed 9-11 kmph
- Beds 01
- Fish hold capacity 01
- Engine capacity 250hp



❖ අඩි 32 ක් දිගැති ගිලන් යාත්‍රාව (එන්ජිම පිටත සවි කරන)

- Length 32ft 3in
- Beam 10ft 2in
- Draft 3ft
- Fuel 750l
- Cupboard 3
- Water 150l
- Oxygen cylinder holder 02
- Hooks for seyline bottle 02
- Seats 03
- Bench for 4 people 01
- Sink and water tap 01
- Cloth hanger 01
- Empty box first aid 01
- Emergency ladder s/s 01
- Rexin covered mattress for beds 02
- Toilet with water 01



❖ **Leisure Boat (24ft) – without engine**

- Length 7.3m
- Beam 2.24
- Depth 0.16m
- Draft 0.45m
- SS canopy with sunbrella cloth



❖ **Flat Bottom Boat (18 1/2ft - 19 1/2ft) – without engine**

- Length 18ft 5in - 19ft 6in
- Beam 6ft 5in - 6ft 6in
- Depth 2ft 6in - 2ft 9in
- Draft 5in



❖ House Boat

- Length: 10.91m
- Width:5.48m
- Height:3.65m
- Room: 12 × 3ft



❖ Ferry

- Length: 5.63m
- Beam: 1.82 m
- Nonskid Floor Board: 8” × 6”
- Draft: 3 inch



❖ Pedal Boat

- Length: 7ft-8ft
- Width:5ft
- Depth: 1ft
- Seating Capacity: 2





අනෙකුත් නිෂ්පාදන

❖ පාපැදි වල මසුන් අලෙවිකරන මාළු පෙට්ටි





❖ අලෙවි කුටි

- Length: 6ft
- Width: 6ft
- Height:10ft-6ft



❖ කරදිය සහ මිරිදිය යාත්‍රා ඔරු

- Length: 13’, 15’, 15½’, 18½





❖ **Security Hut**

- Length: 7ft
- Width: 3ft
- Height:2ft

❖ මසුන් කල් තබා ගැනීමේ අයිස් පෙට්ටි

- Length: 7ft
- Width: 3ft
- Height:2ft



❖ ජීවිතාරක්ෂක වලලු





සීනෝර් පදනමෙහි අනාගත සැලසුම්

➢ කරෛනගර් යාත්‍රාංගනයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.

සීමාසහිත සීනෝර් පදනමට අයත්ව උතුරු ප්‍රදේශයේ කරෛනගර්හි පිහිටි යාත්‍රාංගනය යුද්ධමය තත්වයන් හේතුවෙන් විනාශයට පත්ව තිබූ අතර එය නැවත අංග සම්පූර්ණ යාත්‍රාංගනයක් බවට මේ වන විට පත් කර ඇත. මෙහි මෙහෙයුම් කටයුතු සීනෝර් ආයතනය මගින්ම හෝ වෙනත් තුන්වන පාර්ශවයක් මගින් හෝ සිදු කර එහි ප්‍රතිලාභ අත් කර ගැනීමට සැලසුම් සකස් කර ඇත.



➢ පුනර්ජනනීය බලශක්ති (සූර්ය බල) ව්‍යාපෘතිය.

සීනෝර් පදනමේ කළමනාකාරීත්වය විසින් තුන්වන පාර්ශවයක් සමග ඒකාබද්ධව කරෛනගර් යාත්‍රාංගනය තුළ එහි මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය විදුලි බලය ලබා ගැනීම සඳහා අවශ්‍ය සූර්ය බල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ඒ මගින් ආයතනයෙහි ආදායම වැඩි දියුණු කර ගැනීමට අපේක්ෂා කරන අතර, ජාතික ආර්ථිකයෙහි දළ ජාතික නිෂ්පාදිතයට ලබාදෙන දායකත්වය ඉහළ නැංවීමට ද බලාපොරොත්තු වෙමි.

➢ ජංගම වැඩහල් සංවර්ධනය කිරීමේ සංකල්පය.

සුළු හා මධ්‍ය පරිමාණ ධීවර ප්‍රජාවගේ ධීවර ආම්පන්න සහ යාත්‍රා අළුත්වැඩියා කිරීම පහසු කිරීමේ අරමුණින් දීපව්‍යාප්තව ජංගම අළුත්වැඩියා කිරීමේ වැඩහල් ආරම්භ කිරීමට ව්‍යාපෘතියක් සකස් කර ඇත. මේ සඳහා වෙළඳපොළ තුළ නව අවස්ථාවන්ද පවතින බවට අප විසින් සිදු කරන ලද සමීක්ෂණයන්ගෙන් හෙලි වී ඇත. ඊට අමතරව ධීවර ජනතාවට අවශ්‍ය අළුත්වැඩියා කටයුතු ඔවුන් සිටින ප්‍රදේශයටම ගොස් සිදු කිරීමට ද අපේක්ෂා කරයි.

➢ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය ශීතාගාර පහසුකම් සැපයීම.

නැවුම් මත්ස්‍ය අස්වැන්නක් පාරිභෝගික ජනතාව වෙත ලබා දීමේ අරමුණු පෙරදැරිව සීනෝර් පදනම මගින් අවශ්‍ය පරිදි ශීතාගාර පහසුකම් මෙම යාත්‍රාංගනය තුළ ස්ථාපිත කිරීමට අපේක්ෂා කරයි. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ ධීවර ජනතාවට අවශ්‍ය පහසුකම් සැලසීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමද මෙහි තවත් අරමුණකි. ඒ අනුව අප විසින් මූලික අදියර වශයෙන් මන්නාරම් දිස්ත්‍රික්කය තුළ ටොන් 20 ක ධාරිතාවයෙන් යුක්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඇත.





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/18/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 පෙබරවාරි 10 දින

CEY-NOR FOUNDATION (PVT) LTD
14 FEB 2020
COLOMBO-10

සීමාසහිත සිනෝර් පදනම

දිනය 2020/02/14

සභාපති

සීමාසහිත සීනෝර් පදනම

සීමාසහිත සීනෝර් පදනමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- ලේකම් - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

ලේකම් - මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

මගේ අංකය
எனது இல.
My No. } එන්එල්එස්/බී/සීඑන්එෆ්එල්/6/18/15

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2020 පෙබරවාරි 10 දින

සභාපති
සීමාසහිත සිනෝර් පදනම

සීමාසහිත සිනෝර් පදනමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත සිනෝර් පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පදනමට අයිති රු.1,300,000 ක් වූ ට්‍රැක්ටර් සහ ට්ලර්, බදු දේපලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කුලී පදනම මත බදු දුන් ඉඩම් 4 ක කුලී ආදායම මත ලැබිය යුතු රඳවා ගැනීමේ බදු රු.179,360 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විකුණුම් අත්තිකාරම් ලැබීම්, විකුණුම් අත්තිකාරම් ගිණුමක බැර ලෙස සටහන් කරනු වෙනුවට ණයගැති ලෙජරයේ බැරට සටහන් කර තිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය හා විකුණුම් අත්තිකාරම් ලැබීම් රු.53,869,409 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට ණයගැති උපලේඛනයේ සඳහන් රු.65,029,996 ක් වූ වෙළඳ ණයගැති ශේෂයන්ගෙන් සහ රු.53,712,377 ක් වූ සෘණ ණයගැති ශේෂයන්ගෙන් ශේෂ සනාථන කැඳවූවත් 2019 සැප්තැම්බර් 15 දින වන විට සනාථන ලිපි ලැබී තිබුණේ රු.8,189,309 ක් වූ වෙළඳ ණයගැති දෙදෙනෙකුගෙන් හා රු.16,278,140 ක් වූ සෘණ ණයගැතියකුගෙන් පමණි. ශේෂ සනාථන ලද වෙළඳ ණයගැති ශේෂ දෙකෙහි ශේෂ, ආයතනයේ පොත්වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.10,212,612 ක වෙනසක් තිබුණ ද, ඊට හේතු විගණනයට ඉදිරිපත් කිරීමට පදනම අපොහොසත් විය.

(ඉ) පදනමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නෝර්ත් සී සමාගම නමින් ජංගම වත්කමක් හා වෙළඳ ණයගැති උපලේඛනයේ ණයගැතියෙකු ලෙස පිළිවෙලින් රු.9,204,498 ක් හා රු.17,090,164 ක් දක්වා තිබුණ ද, අදාල ශේෂයන් නොර්ත් සී සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල, පදනමට ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා නොතිබුණි. තවද පදනමේ වෙළඳ ණයහිමි උපලේඛනයේ එම සමාගම රු.18,638,777 ක ණයහිමියකු ලෙස දක්වා තිබුණත්, නොර්ත් සී සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පදනමෙන් ලැබිය යුතු ලෙස 2018 හා 2019 මාර්තු 31 දිනට දක්වා තිබුණේ පිළිවෙලින් රු.2,101,138ක් හා රු.3,913,942ක් පමණි. තවද ණයහිමි ශේෂය සනාථ කර ගැනීමට යවන ලද ශේෂ සනාථන ලිපියට පිළිතුරු ලැබී නොතිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ලැබිය යුතු ශේෂය තුල අනෙකුත් අත්තිකාරම් ලෙස දක්වා තිබූ රු.11,179,064 ක ශේෂයෙන් 2013 සිට 2017 වර්ෂයන්වලදී ලබා දී තිබූ රු.8,037,027 ක් වූ අත්තිකාරම් 2019 සැප්තැම්බර් 19 දින දක්වා නොපියවා තිබුණ ද අදාල ශේෂයන් පියවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(උ) 2018 දෙසැම්බර් 31 දිනට රු.1,897,664 ක් වූ අනෙකුත් ලැබිය යුතු ශේෂය සඳහා කිසිදු ලිඛිතමය සාක්ෂියක් පදනම සතුව නොතිබුණු අතර එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදි තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(උ) 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනයන් හී මත්තුමගල ඉඩමෙහි ආයෝජන දේපළ ආදායම් ලෙස රු.2,700,000 ක් දක්වා තිබුණ ද, එම දේපලෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(එ) පදනම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට සම්මුචිචිත ක්ෂය වෙන්කිරීම් ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සම්මුචිචිත ක්ෂය වෙන්කිරීම් ශේෂය අතර රු.4,789,500 ක වෙනසක් පැවතුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 29 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපාන ප්‍රමාණාත්මක තොරතුරු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් හෙළිදරව් කළ යුතු වුවත්, පදනම සතු රු.73,136,262 ක් වටිනා ඉඩමක් බදුදීම සම්බන්ධයෙන් පුද්ගලික සමාගමක් සමඟ වූ බදු ගිවිසුමෙහි බදු කාල සීමාව 2018 ජූලි 03 දිනෙන් අවසන් වීමත්, එම පුද්ගලික සමාගම නැවත කුලී පදනම යටතේ එය ලබා ගැනීමට නඩුවක් පවරා තිබීමත් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 33 ඡේදයට අනුව සෑම පසු කාලපරිච්ඡේදයකදීම තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳව නව තක්සේරුවක් කළ යුතු වුවත් පදනම එසේ සිදු නොකර රු.6,848,376 ක් වූ සංචලනය නොවන තොග හා රු.1,593,044 ක් වූ සෙමින් සංචලනය වන තොග සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

(ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 හි 5.5 ඡේදය ප්‍රකාරව දිගුකාලයක් ණයගැතියන් ලෙස පවතින ශේෂ වෙනුවෙන් හානිකරණ අලාභ හඳුනාගෙන ඒ අනුව අවශ්‍ය ගැලපීම් කළ යුතු වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ 2011 වර්ෂයේ සිට පෙන්නුම් කරන එකතුව රු.26,294,662 ක ශේෂය සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

(ක) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 වන ඡේදය ප්‍රකාරව පදනමේ ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලි 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර 2018 දෙසැම්බර් 31 දිනට සාධාරණ වෙළඳ වටිනාකම අනුව ගිණුම්වලට සිදුකළ යුතු ගැලපීම් කර නොතිබුණි.

(ග) 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය ශූන්‍ය වූ රු.74,427,651 ක දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 6 හා 51 වන ඡේද ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

(ව) සීමාසහිත සීනෝර් ඔරියන්ට් පර්ල් සී ෆූඩ් අවන්හල පිහිටි රූඩ් 2 යි පර්චස් 12 ක් වූ ඉඩම හා මට්ටක්කුලිය යාත්‍රාංගනයේ වර්ග අඩි 25,000 ක ගබඩාව පිළිවෙලින් 1998 ජූලි 04 දින සිට වසර 20 ක් සඳහා සහ 2017 පෙබරවාරි 08 දින සිට වසර 05 ක් සඳහා බදු දී තිබුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 හි 75 හා 79 ඡේද ප්‍රකාරව ආයෝජන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කරනු වෙනුවට, දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

- පදනමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 784(1)	රජයේ ආයතනවලට අවශ්‍ය වන කම්කරු සේවාවන් ප්‍රසිද්ධ ටෙන්ඩර් නොකැඳවා සේවයේ මුළු වටිනාකම නොසලකා කොන්ත්‍රාත්තුවක් මත ලියාපදිංචි සමූපකාර සමිතිවලට හා විවිධ සේවා සමුපකාර සමිතිවලට දිය යුතු බව ඉතා පැහැදිලිව දක්වා තිබියදී පදනම විසින් වසර 12 ක් තිස්සේ යාත්‍රාංගනයේ බෝට්ටු නිෂ්පාදනය සඳහා පුද්ගල නමින් වූ ආයතන තුනකින් කම්කරු සේවා ලබාගැනීම වෙනුවෙන් 2018 ජනවාරි සිට 2019 අගෝස්තු 31 දක්වා රු.28,382,822 ක මුදලක් ගෙවා තිබුණි. එසේම යාත්‍රාංගනයේ ශ්‍රම පිරිවැය වාර්තා අනුව නිෂ්පාදනයේ ශ්‍රම පිරිවැය රු.10,263,857 ක් වුවද රු.13,118,965 ක් වූ ශ්‍රම පිරිවැය වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොවීය.
(ආ) 2003 ජූලි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය	සීනෝර් පදනමේ සංයුක්ත සැලැස්ම 2019 සැප්තැම්බර් 30 දින වන විටත් සකස් කර නොතිබුණි.
(ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 දරන වගන්තිය	2018 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත 2019 සැප්තැම්බර් 04 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පදනමේ විධායක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන සීනෝර් පදනමට අයිති රු.මිලියන 73 ක වටිනාකම ඇති ඉඩම අවන්හලක් සඳහා බදු දී තිබූ අතර එය ආපසු ලබාගැනීමට කටයුතු කිරීමේ දී බදු ගැණුම්කරු විසින් රිට් ආඥාවක් ලබාගැනීමට කටයුතු කර තිබුණි. එහෙත් පදනම ඊට එරෙහිව කටයුතු නොකිරීම හේතුවෙන් එකී දේපල ආපසු ලබාගැනීමටත් ආදායම් ලබාගැනීමටත් නොහැකි වී තිබුණි.

(ආ) පදනමේ ප්‍රධාන කාර්යාලයේ හා මට්ටක්කුලිය යාත්‍රාංගනයේ ආරක්ෂාව සඳහා සැපයුම්කරුවන් සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව රු.1,376,413 ක් වැයකර ප්‍රධාන කාර්යාලයේ කැමරා 28 ක්, මට්ටක්කුලිය යාත්‍රාංගන 1 හි කැමරා 14 ක් හා යාත්‍රාංගන 2 හි කැමරා 16 ක් 2017 අප්‍රේල් 30 දින සවි කර තිබුණි. මේ වන විට මට්ටක්කුලිය යාත්‍රාංගන 1 හි කැමරා 7 ක් අක්‍රියවීම හේතුවෙන් සීසීටීවී කැමරා පද්ධතිය නිරීක්ෂණය කිරීමට නොහැකි ලෙස මොනිටරය ක්‍රියාවිරහිතව තිබුණි. සැපයුම්කරු සමඟ ගිවිසුම්ගත නොවීම හේතුවෙන් අවශ්‍ය පසු සේවාවන් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) සීනෝර් පදනම සහ පුද්ගලික සමාගමක් සමඟ ඇති කරගත් ගිවිසුමේ 7(a) කොන්දේසිය ප්‍රකාරව මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ වැඩපළේ ඒ ඒ වර්ෂවල පිරිවැටුමෙන් සියයට 3 ක් හෝ අවම කුලි අය කිරීමට ගිවිසුම් ගතව තිබුණ ද, 2006 සිට 2018 දක්වා වූ වසර 13 ක කාලයට අදාල එම සමාගමේ විගණිත ගිණුම් පරීක්ෂා කර ලැබිය යුතු මාසික කුලිය ගණනය නොකර අදාළ වන අවම කුලිය පමණක් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) 2009 ජනවාරි 01 දිනට රු.940,000 කට මිළටගත් ලියවන පට්ටල් උපකරණයක් (Lathe machine) උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටිය දී 2012 වර්ෂයේ දී රු.1,658,705 ක් වැයකර තවත් එවැනි උපකරණයක් මිලදී ගෙන කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව ගබඩා කර තිබුණි.

(ඉ) බෝට්ටු නිෂ්පාදනය කිරීමේ දී නොසෙල්වෙන ගතිය විශ්ලේෂණය කිරීමට හා බෝට්ටු සෑදීමට අවශ්‍ය නිර්මාණ කටයුතු සඳහා යොදා ගැනීමට පදනම විසින් පැරා මැරයින් මෘදුකාංගයක් 2013 දෙසැම්බර් 16 දින රු.9,664,514 කට මිලටගෙන තිබුණ ද එය භාවිතයට නොගෙන අඩි 59.5 බෝට්ටු නිෂ්පාදනයේ දී නොසෙල්වෙන ගතිය විශ්ලේෂණය කිරීමට හා සැලසුම් සකස් කරවා ගැනීමට අදාල සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.මිලියන 2.25 ක් ගෙවා තිබුණි.

(ඊ) 2012 අගෝස්තු 20 දින රු. 5,395,137 කට මිලට ගෙන තිබුණු ජෙල්කෝට් ස්ප්‍රේ ගන් යන්ත්‍රයක් වසර 05 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(උ) 2013 මාර්තු 05 දින රු. 4,166,964 කට මිලට ගෙන තිබුණු ප්ලාස්මා කැපුම් යන්ත්‍රය (Plasma Cutter Machine) වසර 05 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව අනාරක්ෂිතව ගබඩාකර තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් භාවිතයෙන් ඉවත් කර තිබුණු රු.666,000 ක් වටිනා බෝට්ටු අච්චු සම්බන්ධයෙන් අපහරණ ක්‍රියාවලියක් සිදුකර නොතිබුණි.

(එ) 2019 මාර්තු 22 දින කරන ලද ඉන්ධන කාර්යක්ෂමතා පරීක්ෂණයට අනුව ලීටරයට කිලෝමීටර 8.695 ක් ලෙස ගණනය කර තිබූ කිලෝමීටර් 292409 ක් ධාවනය කර තිබුණු අංක 301 - 5405 දරන මෝටර් රථය 2019 වර්ෂයේ මැයි 27 දිනෙන් පසු ඉන්ධන දහනය වැඩි බව දක්වා ධාවනයෙන් ඉවත්කර සීනෝර් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ඒ) 2016 වර්ෂයේ දී රු.317,000 ක් ගෙවා පුද්ගලික ආයතනයක් ලවා පිළියෙල කරගෙන තිබූ පරිපාලන කාර්යය පරිපාටි අත්පොත වසර 3 ක කාලයක් ගතවී තිබිය දීත් ඒ සඳහා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සීමාසහිත සීනෝර් පදනම කොන්ත්‍රාත්කරුවකු මඟින් බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනය කරවාගැනීමේ දී එක් යාත්‍රාවක් වෙනුවෙන් රු.24,700,000 ක් වූ ගිවිසුම්ගත මුදල ඉක්මවා රු.2,884,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) 2016 නොවැම්බර් 16 දින සීමාසහිත සීනෝර් පදනම විසින් බහුදින ධීවර යාත්‍රා තුනක් නිෂ්පාදනය කරවා ගැනීම සඳහා බාහිර පාර්ශවයන් තිදෙනකු සමඟ ඇතිකර ගත් ගිවිසුමේ 4(අ) වගන්තිය ප්‍රකාරව රු.14,320,000 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. බෝට්ටු නිෂ්පාදනය කර භාරදී නොතිබියදී රු.14,320,000ක් වූ බැංකු සුරක්ෂණයෙහි කාලය දීර්ඝ කිරීමේදී එහි වටිනාකම රු.3,705,000 දක්වා අඩුකර තිබුණත් කොන්ත්‍රාත්කරුට ගෙවූ අත්තිකාරම් කිසිවක් අයකර ගෙන නොතිබුණි.

(ක) උක්ත ගිවිසුමේ 8 වන වගන්තිය ප්‍රකාරව භාණ්ඩ සැපයීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා සියයට 10 ක උපරිමයකට යටත්ව මූලික කොන්ත්‍රාත් පිරිවැයෙන් දිනකට සියයට 0.1 ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අයකළ යුතුවුවත්, 2017 මාර්තු 31 දිනට භාරදිය යුතු බෝට්ටු 2019 අගෝස්තු 31 දින දක්වාම භාරදී නොතිබීම හේතුවෙන් අයකළ යුතු රු.7,416,000 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ග) පෞද්ගලික අංශය විසින් නිෂ්පාදනය කරනු ලබන යාත්‍රා 5 ට අදාලව උපදේශන ගාස්තු ලෙස රු.6,500,000 ක් සිනෝර් පදනම වෙත ගෙවා තිබුණ ද 2019 නොවැම්බර් 30 දින දක්වාම අදාල යාත්‍රා නිෂ්පාදනය කර භාරදීමට කටයුතු කිරීමට නිෂ්පාදකයා පෙළඹවීම සඳහා සිනෝර් පදනම කටයුතු කර නොතිබුණි.

(ච) 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගැණුම්කරුවන්ගේ ඉල්ලුම පදනම් කරගෙන කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව රු.4,515,923 ක ගිලන්රථ බෝට්ටුවක්, රු.8,741,820 ක පාලම් පාරුවක් හා රු.11,777,495 ක දැල් ආම්පන්න නිෂ්පාදනය කර සැපයීමේ දී, එම ගැණුම්කරුවන් ඒවා ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පදනමට රු.25,035,238 ක අලාභයක් සිදුවී තිබුණි.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) පදනමේ සාමාන්‍යාධිකාරිවරයා බඳවා ගැනීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් නිර්ණායකවලට අනුකූලව ලකුණු ලබානොදීම නිසා සුදුසුකම් සහිත අයකු ඉවත් වී සුදුසුකම් රහිත අයකු 2015 නොවැම්බර් 03 දින පත්කර එදින සිට 2019 අගෝස්තු දක්වා ඔහුගේ රු.5,548,349 ක වැටුප් හා දීමනා සහ අර්ථසාධක අරමුදලේ දායක මුදල් ලෙස රු.5,548,349 ක් වැයකර තිබුණි.

(ආ) උප කොන්ත්‍රාත් පදනම යටතේ මාළු දැල් නිපදවීමට පුද්ගලික ආයතනයකට රු.5,059,049 ක් වටිනා අමුද්‍රව්‍ය අත්තිකාරම් ලබාදී තිබුණු අතර එයින් රු.149,274 ක් වටිනා දැල් පමණක් පදනම වෙත ලැබී තිබුණි. ඒ අනුව රු.4,909,775 කට අදාල දැල් නොසැපයීම හේතුවෙන් එම ශේෂය 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කළ ද, අදාල අත්තිකාරම් මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය සඳහා පදනමේ ගොඩනැගිලි සහ භූමි පරිශ්‍රය භාවිතා කිරීමට අදාලව ධීවර අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.3,527,824 ක් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඈ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් අංක PB – 8393 දරන කැබ් රථය, අංක LY - 0107 දරන ප්‍රයිම් මුවර් රථය හා අංක 50 - 4414 දරන කෘ කැබ් රථය පදනමේ ප්‍රයෝජනය සඳහා 2006 වර්ෂයේ සිට යොදාගෙන තිබුණ ද, ඒවා පදනම වෙත පවරා ගැනීමට හෝ අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2018 දෙසැම්බර් 14 දින සිට පදනමේ කාර්යන්හි නිරත වී නොසිට 2019 පෙබරවාරි 25 දින පදනමෙන් ඉවත් වූ කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ වැටුප් හා දීමනා ලෙස රු.193,540 ක් ද ඔහුට වෙන්කර තිබුණු කැබ් රථයේ රියැදුරුගේ වැටුප් හා සංයුක්ත දීමනා ලෙස රු.135,540 ක් ද වැයකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සමස්ථ ආදායම් ප්‍රකාශය

2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට

	සටහන	2018 (රුපියල්)	2017 (රුපියල්)
අඛණ්ඩ මෙහෙයුම්			
ආදායම	3	222,490,308.69	153,589,267.75
විකුණුම් පිරිවැය	4	(203,144,250.20)	(78,680,496.84)
දළ ලාභය / (පාඩුව)		**19,346,058.49**	**74,908,770,91**
ඉදිකිරීම් සහ වෙළඳ කටයුතු වලින් ලැබූ දළ ලාභය	5	(10,018,220.65)	(30,051,695.12)
අනෙකුත් මෙහෙයුම් ආදායම	6	(1,158,421.15)	33,681,170.50
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	7	(4,157,480.71)	(6,971,847.99)
පරිපාලන වියදම්	8	(59,575,752.96)	(64,581,850.20)
අනෙකුත් මෙහෙයුම් වියදම්	9	(802,654.23)	(796,195,65)
මෙහෙයුම් ලාභය		**(56,366,471.21)**	**6,188,352.45**
මූල්‍ය ආදායම	10	6,514,744.09	9,524,061.16
අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පෙර ලාභය		**(49,851,727.12)**	**15,712,413.61**
ආදායම් බදු වියදම්	11	(4,835,327.00)	(3,332,771.00)
අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය		**(54,687,054.12)**	**12,379,642.61**
අත්හිටුවනු ලැබූ මෙහෙයුම්			
වර්ෂයේ අත්හිටුවනු ලැබූ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය		-	-
වර්ෂයේ ලාභය		**(54,687,054.12)**	**12,379,642.61**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

2018 වර්ෂයේ දෙසැම්බර් **31** වන දිනට

	සටහන	**2018** (රුපියල්)	**2017** (රුපියල්)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, යන්ත්‍ර හා උපකරණ	12	294,930,251.53	306,722,462.53
ශ්‍රී බංග්ලා බෝට්ටු ආයෝජනය		1,961,850.00	1,961,850.00
		296,892,101.53	**308,684,312.53**
ජංගම වත්කම්			
තොග	13	76,653,398.35	110,876,047.52
සීමාසහිත නෝත්සී සමාගම		9,204,498.31	9,204,498.31
වෙළඳ ණයගැතියෝ	14	15,431,448.48	4,919,072.64
කාර්යමණ්ඩල ණයගැතියෝ	15	11,713,540.42	10,266,964.81
අනෙකුත් ලැබීම්	16	34,603,853.16	34,310,470.78
ඉල්ලුම් තැන්පතු		-	1,300,000.00
ස්ථාවර තැන්පතු		12,000,000.00	50,000,000.00
බැංකු හා මුදල්	17	45,857,849.48	30,383,956.54
		205,464,588.20	**251,261,010.60**
මුළු වත්කම්		**502,356,689.73**	**559,945,323.13**
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		40,000,000.00	40,000,000.00
ආදායම් සංචිත		260,559,447.73	260,559,447.73
ප්‍රාග්ධන සංචිතය		62,601,030.04	62,601,030.04
රඳවාගත් ලාභය / (අලාභය)		(13,479,835.68)	41,207,218.44
මුළු ස්කන්ධය		349,680,642.09	**404,367,696.21**
ජංගම නොවන වගකීම්			
අමාත්‍යාංශ ප්‍රධාන	18	2,078,392.40	2,078,392.40
විලම්භිත වගකීම්	19	32,977,820.98	37,654,143.28
ණයගැනීමේ පොලී	20	-	1,356,722.84
		35,056,213.38	**41,089,258.52**

ජංගම වගකීම්			
ණයගැනීමේ පොලී	21	1,356,722.83	1,487,795.31
වෙළඳ ගැතියෝ	22	39,681,128.30	53,117,106.75
අනෙකුත් ගෙවිය යුතු	23	71,746,656.47	59,208,472.68
ගෙවිය යුතු ආදායම් බදු	24	581,293.00	674,993.66
විලම්භිත ආදායම් බදු වගකීම	24.1	4,254,033.00	-
		117,619,833.60	**114,488,368.40**
මුළු වගකීම්		**152,676,046.98**	**155,577,626.93**
මුළු ස්කන්ධය හා වගකීම්		**502,356,689.07**	**559,945,323.13**

ස්කන්ධයන්ගේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	කොටස් ප්‍රාග්ධනය (රු.)	ප්‍රාග්ධන සංචිත (රු.)	ප්‍රත්‍යාගනන සංචිත (රු.)	සමුච්චිත ලාභය / (අලාභය) (රු.)	මුළු ස්කන්ධය (රු.)
2017 ජනවාරි 01 වන දිනට ශේෂය	40,000,000.00	62,601,030.04	260,559,447.73	28,827,575.83	391,988,053.60
වර්ෂයේ ශුද්ධ අලාභය	-	-	-	12,379,642.61	12,379,642.61
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**40,000,000.00**	**62,601,030.04**	**260,559,447.73**	**41,207,218.44**	**404,367,696.21**
වර්ෂයේ ශුද්ධ අලාභය	-	-	-	(54,687,054.12)	(54,687,054.12)
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**40,000,000.00**	**62,601,030.04**	**260,559,447.73**	**(13,479,835.68)**	**349,680,642.09**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය

(සියලු අංක රුපියල් වලිනි)	**2018**	**2017**
මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලැබූ මුදල් ප්‍රවාහය		
බදුවලට පෙර ලාභය	(49,851,727.12)	15,712,413.61
එකතු කළා :		
ක්ෂය කිරීම්	12,886,021.01	3,895,612.50
පාරිතෝෂික වෙන් කිරීම්	3,047,299.50	3,175,696.50
කාරක ප්‍රාග්ධන වියදම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(33,918,406.61)**	**22,783,722.61**
තොගවල අඩු කිරීම්/ වැඩි කිරීම්	34,222,649.17	(69,066,325.52)
වෙළඳ හා අනෙකුත් ලැබීම් වල අඩු කිරීම් / වැඩි කිරීම්	(12,252,333.83)	114,786,025.85
වෙළඳ හා අනෙකුත් ගෙවීම් වල අඩු කිරීම් / වැඩි කිරීම්	(1,479,087.20)	(70,109,204.78)
විලම්භීත ආදායම් අඩු කිරීම් / වැඩි කිරීම්	(6,332,916.80)	(11,315,087.89)
මෙහෙයුම් ක්‍රියාවලින් උත්පාදනය කල මුදල්	(19,760,095.27)	(12,920,869.73)
අඩුකලා :		
ආයෝජන ආදායම්	(6,514,744.09)	(9,524,061.16)
ආදායම් බදු ගෙවීම්	(93,700.66)	(9,098,621.74)
පාරිතෝෂික ගෙවීම්	(1,390,705.00)	(1,682,434.00)
මෙහෙයුම් ක්‍රියාවලින් උත්පාදනය කරන ලද දළ මුදල්	**(27,759,245.02)**	**(33,225,986.63)**
ආයෝජන ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහ		
දේපළ යන්ත්‍ර උපකරණ මිලට ගැනීම් / විකිණීම්	(1,093,810.04)	(18,676,639.58)

ආයෝජන ආදායම්	6,514,744.09	9,524,061.16
කෙටි කාලීන ණය	-	-
ආයෝජන ක්‍රියා වලට යෙදූ ශුද්ධ මුදල්	5,420,934.05	20,580,572.10
මූල්‍ය කටයුතු වලින් ජනිත වුන මුදල් ප්‍රවාහ		
කල්බදු හිමියන්ට ගෙවීම්	(1,487,795.31)	(1,348,339.07)
මූල්‍ය ක්‍රියාකාරීත්වයන් සඳහා යෙදූ මුදල	**(1,487,795.31)**	**(1,348,339.07)**
මුදල් හා මුදල් සමාන වත්කම් වල මුලු වැඩිවීම්	**(23,826,106.28)**	**(13,993,753.59)**
සටහන A		
මුදල් සහ මුදලට සමාන ආරම්භක ශේෂය	81,683,956.54	95,677,710.13
සටහන B		
කාල පරිච්ඡේදය අවසාන මුදල් සහ මුදලට සමාන ශේෂය	**57,857,850.26**	**81,683,956.54**

	A සටහන	B සටහන
මහජන බැංකුව රැජින වීදිය ශාඛාව - 87847	463,235.93	134,214.23
හැටන් නැෂනල් බැංකුව - 16031	645,352.29	2,388,767.56
හැටන් නැෂනල් බැංකුව - 10002143	26,823.58	26,823.58
පෑන් ඒෂියා බැංකුව - 135670117	2,941.80	2,941.80
සුළු මුදල් අග්‍රිමය	152,000.00	142,000.00
ඉන්ධන අග්‍රිමය	55,000.00	55,000.00
ඉල්ලුම් තැන්පතු	1,300,000.00	-
ලංකා බැංකුව - 72322913	21,192,032.41	16,915,987.32
ලංකා බැංකුව කොළඹ ශාඛාව - 1450	7,846,570.53	26,192,114.99
ස්ථාවර තැන්පතු	50,000,000.00	12,000,000.00
	81,683,956.54	57,857,849.48

2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන්

01. සංයුක්ත තොරතුරු

1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

සීමාසහිත සිනෝර් පදනම ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කළ සමාගමකි. ලියාපදිංචි කාර්යාලය අංක 335, සී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන බෝට්ටු යාත්‍රාංගනය මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටා ඇත. සිල්ලර අලෙවිසැල් තංගල්ල සහ පැලියගොඩ ප්‍රදේශවල පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයවීම්

රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ඇණවුම් වලට අනුව යාත්‍රාංගනයේ නිෂ්පාදනය කරන ලද යාත්‍රා සහ භාණ්ඩ අලෙවිය සහ අනෙකුත් ධීවර ආම්පන්න මිලදී ගැනීම සහ අලෙවි කිරීම් ලෙස සඳහන් කල හැක.

1.3 ව්‍යවසායිකත්වයේ අයිතිය

පූර්ණ රජය සතු සමාගමකි.

සේවක සංඛ්‍යාව

වර්ෂය අවසාන වන විට සමාගමේ සේවක සංඛ්‍යාව 86 ක් විය.

02. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 සැකසීමේ පදනම

2018 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සමස්ථ ආදායම් ප්‍රකාශනය ව්‍යාපාර වස්තු කොටස් අයිතිය සහ මුදල් ප්‍රවාහ සහ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සමග අනුගත වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන උද්ධමනකාරී සාධක වල බලපෑම් වලින් තොරව සකස් කර ඇත.

2.1.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් සහ සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග අනුගත වීම.

වර්ෂය තුල නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම.

පෙර වර්ෂවල අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ වර්ෂයේ ද නොවෙනස්ව පැවතින.

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ප්‍රමාණවත් පරිදි යොදාගත් ගිණුම් ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී යොදාගත් ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූල වේ. පෙර වර්ෂයේ වාර්තා වුණු සංඛ්‍යා හා වාක්‍යයන් මෙම වාර්තා වලට උචිත වන පරිදි නැවත සකස් කර ඇත.

2.1.4 විදේශ මුදල් ගණුදෙනු

සියලුම විදේශ විනිමය ගණුදෙනු සිදුවන අවස්ථාවේදී පැවැති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කරනු ලැබේ. විදේශ මුදල් ඒකක වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ පැවැති විදේශ විනිමය අනුපාතිකයන්ට අනකූල වන සේ ශ්‍රී ලංකා රුපියල් වලට වර්ෂ අවසානයේ පැවැති ස්ථානීය විනිමය අනුපාතිකයට අනුකූල වන සේ නැවත ආගණනය කරනු ලැබේ. මෙහි ප්‍රථිපලයක් වශයෙන් අත්කරගත් ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

2.1.5 බදුකරණය

වත්මන් බදු

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආකාරයට 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූල වන සේ ගණනය කර සමාගමට අදාල කර ගතයුතු අනුපාතිකයට අනුව සිදු කර ඇත.

2.1.6 ශේෂ පත්‍රය දිනයට පසුව සිදු කළ ක්‍රියාකාරකම්

ශේෂපත්‍ර දිනයට පසුව සිදු කරන ලද සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් සලකා බලන ලද අතර මූල්‍ය ප්‍රකාශන වල ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කොට ඇත.

2.1.7 ණය ගැණුම් පිරිවැය

කාල පරිච්ඡේදය තුළ දී ණය ගැනීම සඳහා වියදම ණය ගැණුම් පිරිවැය ලෙස සලකන ලදී.

2.2 වත්කම් තක්සේරු කිරීම හා ඒවා ගණනය කිරීමේ පදනම

2.2.1 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ගණනය කරනු ලබන්නේ ශුද්ධ උපලබ්ධි අගය හෝ අඩු වූ පිරිවැයෙන් අභාවිත හෝ හෙමින් නිකුත් වන භාණ්ඩ වල වටිනාකම් ගැලපීමෙනි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණීම සිදු කරන්නේ භාණ්ඩ නිම කිරීමේ පිරිවැය ගැලැපීමෙන් ලැබෙන ශුද්ධ උපලබ්ධි වටිනාකමය. වර්තමාන ස්ථානයට මෙම භාණ්ඩ තොගය ගෙන ඒමේදී වැය වූ පිරිවැය සහ එහි තත්ත්වය පහත සඳහන් සූත්‍රය මගින් ගණනය කරනු ලැබේ.

අමුද්‍රව්‍ය - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

නිෂ්පාදිත නිමි භාණ්ඩ - සෘජු අමුද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිම කල භාණ්ඩ වල ප්‍රතිශතය අනුව සෘජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයයෙන් අදාල පිරිවැය

නොනිමි භාණ්ඩ -සෘජු අමුද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිම කල භාණ්ඩ වල ප්‍රතිශතය අනුව සෘජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයෙහි අදාල පිරිවැය

මිලදී ගත් නිමි භාණ්ඩ - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

අනෙකුත් තොග - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

2.2.2 මූල්‍ය වත්කම්

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ මුලදී මිලට පිළිගනු ලැබේ. සියලු විකුණුම් සාමාන්‍ය ණයවර නියමයන් මත කරනු ලබන අතර ලැබිය යුතු දේ සඳහා කිසිඳු පොළියක් අය නොකෙරේ. සෑම වාර්තා කිරීම් කාල වකවානුවේ අවසානයේදී මුදල් අයකර ගත නොහැකි බවට බාහිර සාක්ෂි තිබේද යන්න තීරණය කිරීමට වාණිජ ධාරණ මුදල් සහ වෙනත් අයවිය යුතු දේ පරීක්ෂා කරනු ලැබේ. එසේ ඇතිනම් ලාභ හෝ අලාභ හානි කරන අලාභයක් සඳහා ගනී.

මුදල් සහ මුදල් සමාන වත්කම් අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ද්‍රව්‍යශීලීතාවයෙන් අග්‍ර ආයෝජන ක්ෂණිකව මුදල් බවට පත් කල හැකි දේ වන අතර වටිනාකම කිසිම විදියේ අවදානමකට භාජනය නොවන්නකි. මුදල් ප්‍රවාහ ප්‍රකාශන වලට ඇතැම් මුදල් සහ බැංකු තැන්පතු අයිරාවල ශුද්ධ හිග මුදල්, කෙටිකාලීනව මෝරන ආයෝජනය වන අතර ඒවා මාස 3 ක් හෝ අත්පත් කරගත් දිනට අඩුනම් මුදල් සමාන වත්කම් ලෙස සළකනු ලබයි.

2.2.3 දේපළ පිරියත සහ උපකරණ

(අ) තක්සේරු පිරිවැය

සියළුම දේපළ පිරියත හා උපකරණ මූලික අවස්ථාවේ ගණනය කරනු ලබන්නේ පිරිවැයෙනි. දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය යනු වත්කම එහි වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද මිලදී ගැනීමේ හා ඉදිකිරීමට අදාළ සියලු වියදම් වේ.

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අගයට වඩා අඩු පිරිවැයෙන් මනිනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණ පසුකාලීනව දරණ ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ එම වියදම් මගින් මෙම වත්කම් වල ක්‍රියාකාරීත්වය වැඩිදියුණු වීමක් සහ ඒ හා බැඳුණු අනාගත ප්‍රථිපල ආයතනයට ගලා ඒමක් සිදු වනවානම් පමණි.

(ආ) ක්ෂය කිරීම්

දේපළ යන්ත්‍ර උපකරණ පැවතිය හැකි ජීව ආයු කාලය සලකා බලා ක්ෂය කිරීමට ක්ෂය වෙන් කිරීම් ගණනය කරනු ලැබේ. එක් එක් වත්කම් කොටස් ක්ෂය කිරීම් ප්‍රතිශතය පහත සඳහන් පරිදි සඳහන් කර ඇත.

ගොඩනැගිලි	-	20	අවුරුදු
යන්ත්‍ර උපකරණ	-	10	අවුරුදු
ගෘහ භාණ්ඩ උපකරණ	-	05	අවුරුදු
සුලු උපකරණ	-	05	අවුරුදු
කාර්යාල උපකරණ	-	05	අවුරුදු
මෝටර් රථ	-	04	අවුරුදු
පරිගනක	-	04	අවුරුදු
මෘදුකාංග	-	05	අවුරුදු
බෝට්ටු අච්චු	-	05	අවුරුදු
කර්මාන්ත උපකරණ	-	08	අවුරුදු
කුලී පදනම මත ලබා ගත් මෝටර් රථ	-	04	අවුරුදු

(ඇ) මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තා කිරීමේ දිනට එවැනි වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට කිසිඳු සාක්ෂියක් ඇත්දැයි තීරණය කිරීමට දේපළ පරීක්ෂා කරනු ලැබේ. සිදුවිය හැකි හානිය පිළිබඳ ඇගවීමක් තිබෙනම් අදාළ වත්කමේ (හෝ අදාළ වත්කම් කාණ්ඩයේ) අය කර ගත හැකි අගය තක්සේරු කරනු ලබන අතර එහි ධාරණ අගයට සසඳනු ලැබේ.

නිමිත අයකර ගත හැකි අගය නම් ධාරණ අගය එහි නිමිත අයකර ගත හැකි අගයට අඩු කරනු ලබන අතර හානිකරණ අලාභයත් හඳුනාගත හැකි විස්තීර්ණ ආදායමේ ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

සමාගමේ වත්කම් සෑම ක්‍රියාත්මක දිනයකදීම ඒවායේ බෙලහීන තත්ත්වය ගැන දැන ගැනීමට හැකි වේ. එසේ බෙලහීන තත්ත්වයක් ඇත්නම් වාර්ෂික බෙලහීන තත්ත්වය සොයා බැලීමේ පරීක්ෂණයකදී එම වත්කම් වලින් ආපසු ලබා ගත හැකි වටිනාකම ගැන තක්සේරුවක් කරනු ලැබේ. එම වත්කම් වලින් ලබා ගත හැකි වටිනාකම එම වත්කම සාධාරණ තක්සේරු වටිනාකමින් විකුණුම් පිරිවැය අඩුකල විට එම වටිනාකමේ අගය තීරණය කරනු ලැබේ. එම වත්කම් වටිනාකම ලබාගත හැකි වටිනාකමේ බෙලහීනතාව ගැන සලකා බලා අයකරගත නොහැකි වටිනාකම ලියා හරිනු ලැබේ.

එම වත්කමේ භාවිත වටිනාකමින් ලැබෙන අනාගත මුදල් ප්‍රවාහය වත්මන් වටිනාකමට පෙර බදු වට්ටම් අනුපාතයෙන් වට්ටම් කලහොත් වත්කම් වෙළඳපොළේ වටිනාකමත්, වත්මන් මුදලේ වටිනාකමත් එම වත්කමේ දැරීමේ අවදානම ගැනත් දැනගත හැකිය.

ආදායම් ප්‍රකාශනයක හානිකර අලාභය බෙලහීන උකරණවල හානිකර අලාභයට පෙර ප්‍රත්‍යාගණන සංචිතයට ප්‍රතිවිරුද්ධ ලෙස ගැලපිය යුතුය. සෑම වාර්තා කරන දිනට තක්සේරුවක් කරනු ලබන්නේ පෙරදී තක්සේරු කළ හානිකර අලාභය නොපැවතීම හෝ අඩුකර දැක්වීමය. පෙරදින හඳුනාගත් හානිකර අලාභය, කීර්ති නාමය හැරුණුවිට වත්කමින් නැවත අයකරගත හැකි මුදල වැඩි වී ඇත්නම් වත්කමට ගලපනු ලැබේ. පෙර හඳුනාගත් හානිකර අලාභයට බලපෑමක් නොවේනම් වත්කමේ වැඩි වීමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.3 වගකීම් හා වෙන්කිරීම්

2.3.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිෂ්චිත පාරිතෝෂික ප්‍රතිලාභ සැලසුම

පාරිතෝෂික දීමනා සැලසුම් කල ප්‍රතිලාභයකි. සමාගමට පාරිතෝෂික දීමනා පනතට අනුව ගෙවීමට හැකියාවක් ඇත. මෙම වගකීම දැරීම සඳහා ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන ආ වෙන් කිරීමක් මුදල් වර්ෂයේ අවසානයේ ලබාගත් වැටුපෙන් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන වන ලෙස සේවා කාලය ආරම්භයේ සිට අදාළ මුදල් වර්ෂය තෙක් ගණනය කර වෙන් කිරීම් සිදු කරයි. ඉදිරියට ගෙන ආ වෙන් කිරීම වර්ෂය ආරම්භයේ ඇති වෙන් කිරීමේ ශේෂයට ගලපා වෙනස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

1983 අංක 12 දරණ පනතේ වගන්ති වලට අනුකූලව වගකීම දැරිය යුත්තේ අඛණ්ඩ සේවා කාලය වර්ෂ 5 සම්පූර්ණ කිරීමෙන් පසුවය. පාරිතෝෂික වගකීම

අරමුදල් ලැබීමක් හෝ සත්‍ය ගණනය කිරීමක් නොවේ. මෙම අයිතමය විලම්භීත වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වයි.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල්

නිශ්චිත දායකත්ව සැලසුම සේවා අර්ථසාධක අරමුදල සහ සේවාභාරකාරීත්ව අරමුදල අදාළ අණපනත් වල වගන්ති අනුව සියළුම සේවකයින් අර්ථසාධක අරමුදලේ සහ සේවාභාරකාරීත්ව අරමුදලේ දායකත්වයෙන් ආවරණය විය යුතුය.

සේවක අර්ථසාධක අරමුදල

අනුමත සේවක අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් සහ සමාගම විසින් පිළිවෙලින් 12% ක් සහ 8% ක් වශයෙන් දායකත්වය දක්වනු ලැබේ.

සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල සඳහා සමාගම විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් **3%** ක් වශයෙන් දායකත්වය දක්වනු ලැබේ.

2.3.2 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් (ගණුදෙනු පිරිවැය ඇතුළත්ව) ගණුදෙනු වියදම් මත මූලිකව හඳුනාගනු ලැබේ. ගෙවිය යුතු දෑ සාමාන්‍ය ණය කාලසීමාව සඳහා ඇති බැඳීම් වන අතර ඒ සඳහා කිසිදු පොළියක් නැත.

2.3.3 ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිශ්චිත අවශ්‍යතා

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිශ්චිත වගකීම් සියල්ල මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් දක්වා ඇත. (සටහන **27**)

2.3.4 ප්‍රතිපාදන

අතීත සිදුවීම්වල ප්‍රථිපල ලෙස සමාගමට ඇති වර්තමාන බැඳියාව (නීත්‍යානුකූල හෝ සාධනීය) දරණ විට ප්‍රතිපාදනයන් ලෙස පිළිගනු ලබයි. තවද සමාගම විසින් වගකීම ඉටුකල යුතු අතර වගකීමේ අගය සඳහා විශ්වාසදායක තක්සේරුවක් කල හැකිය.
මෙම මුදල හඳුනාගනු ලබන්නේ වගකීම වටා ඇති අවදානම් හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්තමාන වගකීම ඉටු කිරීමට ලබා දියහැකි හොඳම තක්සේරුව ලෙසය.

2.4 ආදායම් ප්‍රකාශය

2.4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම වශයෙන් හඳුනාගනු ලබන ප්‍රමාණයට සමාගමට ගලා එන අඩමාන ආදායම හා ආදායමට සම්බන්ධ වන දරන ලද පිරිවැය හෝ දැරිය යුතු පිරිවැයේ විශ්වාසනීයත්වය ගණනය කිරීමයි.

(a) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකුණුම් හඳුනාගනු ලබන්නේ සැලකිය යුතු අවදානම සහ භාණ්ඩ භාරකාරීත්වයේ වාසිය සමාගමෙන් ගැණුම්කරුවා වෙත නිකුත්වීමේ දී රඳවා නොගත් අයිතිය සම්බන්ධයෙන් වූ ආර්ථික සබැඳියාව හෝ විකිණූ භාණ්ඩයේ පාලනයයි.

(b) පොලිය

උපචිත පදනම මත පොලිය හඳුනාගනු ලැබේ.

(c) බදුකුලී ආදායම

උපචිත පදනම මත බදුකුලී හඳුනා ගනු ලැබේ.

(d) අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

(e) ලාභ සහ පාඩු

ශුද්ධ ලාභ හා පාඩු දේපළ උපලබ්දියකදී යන්ත්‍ර උපකරණ ආදායම් ප්‍රකාශනයට ගනු ලබන්නේ අපහරණ වියදම් විකිණීමෙන් ලැබෙන මුදලින් අඩු කිරීමෙන් පසු, දේපළේ අගය ලෙස ගණන් ගනු ලබන්නේ අදාල දේපළෙහි උපලබ්දි වියදම් විකුණුම් වියදම් අඩු කිරීමෙනි. ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ඉතිරිවන ශේෂය කෙලින්ම සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.

(f) රජයේ ප්‍රධාන

අදාල ප්‍රධානය ලැබෙන බවට සහ එම ප්‍රධානයට ඇතුලත් කොන්දේසි වලට අනුකූලව ආයතනය කටයුතු කරන බවට සාධාරණ සහතිකයක් ඇත්නම්, එම ලැබීම් රාජ්‍ය ප්‍රධාන ලෙස හඳුනාගනු ලබයි. විලම්භීත ආදායමක් ලෙස හඳුනා ගන්නා වත්කම් වලට අදාල ප්‍රධානයන් එම වත්කම් ක්ෂය කරනු ලබන කාල පර්ච්ඡේදය තුල කාල සීමාවේ ලාභයට හෝ අලාභයට සමානුපාතිකව ගලපනු ලබයි.

2.4.2 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදමේ පදනම ලෙස හඳුනාගනු ලබන්නේ දරණ ලද පිරිවැයත් ඉපැයූ විශේෂිත අයිතමවල ආදායම අතර වෙනසකි. ව්‍යාපාරය

කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දැරූ සියලු වියදම් සහ දේපළ යන්ත්‍ර නඩත්තුවට දැරූ වියදම් වර්ෂයේ ලාභය නිශ්චය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනයට මාරු කරයි.

2.4.3 ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයේ විවේචනාත්මක විනිශ්චයන් සහ ප්‍රධාන මූලාශ්‍ර

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, වාර්තා කිරීමේ දිනට ආදායමේ වාර්තාගත මුදල, වියදම්, වත්කම් සහ අනිශ්චිත වගකීම් හෙළිකිරීම් වැනි දේට බලපාන විනිශ්ච, තක්සේරු සහ උපකල්පන නිරීමට කළමනාකාරීත්වයට සිදු වේ.

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	2018 (රුපියල්)	2017 (රුපියල්)
සටහන 3 - ආදායම		
යාත්‍රා විකිණීම (දේශීයව)	222,490,308.69	153,210,632.38
අනෙකුත්	-	378,635.37
	222,490,308.69	**153,589,267.75**
සටහන 4 - විකිණුම් පිරිවැය		
ආරම්භක තොගය - අමුද්‍රව්‍ය	15,981,901.09	4,499,882.74
ආරම්භක තොගය - නොනිමි	85,855,038.72	14,800,626.01
ආරම්භක තොගය - නිමි	107,594.96	3,399,096.45
	101,944,534.77	**22,699,605.20**
එකතු කලා		
අමුද්‍රව්‍ය මිලට ගැනීම්	56,714,680.80	52,845,419.87
අනෙක් ද්‍රව්‍ය	42,333,374.72	29,106,095.07
එන්ජින්	15,903,023.61	21,731,482.00
	216,895,613.90	**126,382,602.14**
පියවීම් තොග - අමුද්‍රව්‍ය	(11,938,384.40)	(15,981,901.09)
පියවීම් තොග - නොනිමි	(44,296,992.56)	(85,855,038.72)
පියවීම් තොග - නිමි	(9,686,289.69)	(107,594.96)
පාවිච්චි කල අමුද්‍රව්‍ය පිරිවැය	**150,973,947.25**	**24,438,067.37**
එකතු කලා : සෘජු වියදම්		
වැටුප් හා වේතන	8,593,153.04	7,971,843.26
දීමනා - සෘජු	3,006,105.65	4,074,436.95
අතිකාල - සෘජු	623,142.20	1,110,173.46
සේවක අර්ථසාධක අරමුදල - සෘජු	1,031,178.36	956,621.19
සේවක භාරකාර අරමුදල - සෘජු	257,794.59	239,155.30
පාරිතෝෂික - සෘජු	2,206,321.00	1,133,965.50
උප කොන්ත්‍රාත් වියදම්	23,135,776.78	21,301,729.82
පරීක්ෂණ සහ තත්ත්ව පාලන	-	-
ප්‍රාථමික පිරිවැය	**189,827,418.87**	**61,225,992.85**

එකතු කලා : නිෂ්පාදන පොදු කාර්ය

වැටුප් හා වේතන	2,578,016.80	2,307,864.00
දීමනා	798,109.00	817,010.41
අතිකාල දීමනා	117,703.10	382,483.51
සේවක අර්ථසාධක අරමුදල	309,362.02	276,943.68
සේවක භාරකාර අරමුදල	77,340.50	69,235.92
ක්ෂය කිරීම්	7,053,395.35	11,244,359.62
විදුලිය	838,636.53	844,489.74
උපකරණ නඩත්තු කිරීම්	87,316.17	18,190.81
යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම්	220,060.00	1,940.00
වාහන නඩත්තු කිරීම් - යාත්‍රාංගනය	77,846.30	57,374.72
කුලියට ගත් යන්ත්‍ර සූත්‍ර	141,450.00	291,591.74
පිරිසිදු කටයුතු - යාත්‍රාංගනය	211,340.00	232,257.09
ඉන්ධන හා ලිහිසි තෙල්	322,064.73	290,705.00
ජලය	423,940.83	314,442.25
වෙනත් වියදම් - යාත්‍රාංගනය	60,250.00	305,615.50
නිෂ්පාදිත පිරිවැය	**203,144,250.20**	**78,680,496.84**

සටහන 5 - වෙළඳ ක්‍රියාකාරීත්වයෙන් ලැබූ දළ ලාභය

විකුණුම්	16,341,962.66	92,412,654.54
(-) විකුණුම් පිරිවැය	(26,360,183.31)	(122,464,349.66)
වෙළඳ ක්‍රියාකාරීත්වයෙන් ලැබූ දළ ලාභය	**(10,018,220.65)**	**(30,051,695.12)**
	(10,018,220.65)	**(30,051,695.12)**

සටහන 06 - අනෙකුත් මෙහෙයුම් ආදායම

බදුකුලී ආදායම	16,515,882.36	15,561,176.44
උපදේශන සේවා	-	2,549,019.60
අවන්හලේ ආන්තික ලාභය	323,515.96	418,998.40
ප්‍රවාහනය සහ හසුරුවීම	1,655,620.18	2,054,721.50
රජයේ ප්‍රධාන	(19,667,083.20)	11,315,087.89
කොමිස්	-	96,000.00
වත්කම් බැහැර කිරීම මගින් ලැබීම්	13,643.55	1,686,166.67
	(1,158,421.15)	**33,681,170.50**

සටහන 07 - විකුණුම් බෙදාහැරීමේ වියදම්

ප්‍රවාහනය සහ හසුරුවීම	26,600.00	198,248.19
වාහන අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු	1,481,711.45	2,880,245.22
විකුණුම් ප්‍රවර්ධනය	197,874.00	6,951.00
විකුණුම් කොමිස්	116,446.10	641,683.88
විනෝදාස්වාද කටයුතු	17,760.00	-
පරිත්‍යාග හා තෑගි	20,000.00	245,000.00
ඉන්ධන හා ලිහිසි තෙල්	2,144,472.16	2,558,581.34
වෙළඳ ලියවිලි වියදම	80,500.00	104,663.36
මුද්දර බදු	4,775.00	321,575.00
අලෙවිසැල් මගින් ලැබෙන බදුකුලී	-	8,000.00
බෑමේ හා පැටවීමේ වියදම්	21,500.00	6,900.00
විකුණුම් / විරංජනය කිරීම හා ඇසිරීමේ පිරිවැය	-	-
ප්‍රදර්ශන වියදම්	45,842.00	-
	4,157,480.71	**6,971,847.99**

සටහන 08 - පරිපාලන වියදම්

වැටුප් හා වේතන	22,207,082.49	21,951,432.15
අතිකාල	1,788,194.83	2,296,997.23
දීමනා	4,314,677.14	8,261,267.34
සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම්	2,664,849.89	2,634,171.85
සේවක භාරකාර අරමුදල් ගෙවීම්	666,212.47	658,542.97
දිරි දීමනා හා ප්‍රසාද දීමනා	-	1,192,250.00
පාරිතෝෂික දීමනා	840,978.50	2,041,731.00
දුරකතන වියදම්	712,758.03	946,347.44
සුභ සාධක වියදම්	1,060,450.56	1,588,394.48
තැපැල් වියදම්	32,075.00	32,201.00
කුරියර් වියදම්	2,936.00	77,247.31
ගොඩනැගිලි නඩත්තුව	108,884.00	1,031,729.60
පරිගණක නඩත්තුව	161,265.00	180,202.00
කාර්යාල උපකරණ නඩත්තුව	429,210.09	335,420.54
ජලය	201,231.20	120,301.10

විදුලිය	1,397,657.52	1,638,176.46
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය වියදම්	1,061,412.69	1,375,033.28
දැන්වීම් පල කිරීමේ වියදම්	752,494.50	1,015,554.80
ක්ෂය කිරීම්	5,834,796.98	5,630,669.55
නීති වියදම්	511,630.00	411,105.00
රක්ෂණය	567,364.10	783,776.21
ආරක්ෂක වියදම්	5,518,096.00	3,861,129.04
අන්තර්ජාලය - විද්‍යුත් තැපැල් වියදම	447,798.15	254,865.77
වරිපනම් හා බදු	231,002.80	445,295.04
පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක කටයුතු	621,138.00	573,035.20
වාහන කුලී	1,447,466.67	2,349,794.00
බලපත්‍ර හා ලියාපදිංචි කිරීම	233,419.22	150,751.69
විගණන ගාස්තු	185,000.00	260,500.00
අධ්‍යක්ෂ පරිශ්‍රමිකය	172,500.00	367,750.00
වෛද්‍ය වියදම්	709,415.00	322,855.68
පුහුණුවීම් හා සම්මන්ත්‍රණ	94,350.00	69,797.48
ආහාර හා නවාතැන් ගැනීම	79,645.18	258,196.34
අධිභාර දඩගැසීම් වියදම්	208,605.75	-
උත්සව/ සමාජ රැස්වීම් වියදම්	275,505.00	401,027.17
වියදම් - තත්ව සහතික	135,000.00	-
ලේකම් ගාස්තු	45,000.00	134,600.00
උපදේශන ගාස්තු	3,334,523.47	84,175.00
දේශීය ගමන් වියදම්	521,126.73	845,526.48
	59,575,752.96	**64,581,850.20**

<u>සටහන 09 - අනෙකුත් වියදම්</u>

බැංකු වියදම් හා කොමිස්	587,733.54	441,818.73
කල්බදු පොලී	214,920.69	354,376.92
	802,654.23	**796,195.65**

සටහන 10 - මූල්‍ය ආදායම

පොලී ආදායම	6,514,744.09	9,524,061.16
	6,514,744.09	**9,524,061.16**

සටහන 11 - ආදායම් බදු වියදම්

ගෙවිය යුතු ආදායමට බදු	-	302,266.00
	-	**302,266.00**

මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන්

සටහන 12 - දේපළ හා යන්ත්‍ර උපකරණ සටහන

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2018 ජනවාරි 01 වැනි දිනට	එකතු කිරීම්	අපහරණය	2018 දෙසැම්බර් 31 වැනි දිනට
නිදහස් දේපළ				
ඉඩම්	250,000,000.00	-	-	250,000,000.00
ගොඩනැගිලි	33,172,330.85	84,586.00	-	33,256,916.85
යන්ත්‍ර සූත්‍ර	5,109,912.00	-	-	5,109,912.00
කර්මාන්තශාලා උපකරණ	4,465,944.75	301,250.66	-	4,767,195.41
කාර්යාල උපකරණ	3,345,673.83	202,866.09	-	3,548,539.92
පරිගණක	3,557,598.00	382,922.50	-	3,940,520.50
ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	3,397,914.87	122,184.79	-	3,520,099.66
සුළු උපකරණ	34,923,741.62	-	-	34,923,741.62
ට්‍රෙලරය හා ට්‍රැක්ටරය	2,790,000.00	-	-	2,790,000.00
ධීවර යාත්‍රා හා බෝට්ටු අච්චු	31,631,229.95	-	-	31,631,229.95
මෝටර් රථ	10,587,795.00	-	-	10,587,795.00
කල්බදු දේපළ				
මෝටර් රථ	8,099,107.57	-	-	8,099,107.57
ට්‍රැක්ටරය හා ට්‍රෙලරය	1,300,000.00	-	-	1,300,000.00
වෙනත් වත්කම්				
පරිගණක මෘදුකාංග	10,193,454.00	-	-	10,193,454.00
	402,574,702.44	**1,093,810.04**	**-**	**403,668,512.48**

ක්ෂය කිරීම්	2018 ජනවාරි 01 වන දිනට ශේෂය	වර්ෂය තුල ක්ෂය කිරීම්	අපහරණය	2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය
නිදහස් වත්කම්				
ගොඩනැගිලි	8,558,220.46	1,658,968.92	-	10,217,189.38
යන්ත්‍ර සූත්‍ර	3,220,882.80	510,991.19	-	3,731,874.02

කර්මාන්තශාලා උපකරණ	2,837,996.57	288,130.49	(2,171,.29)	3,123,955.77
කාර්යාල උපකරණ	2,628,717.87	366,934.07	-	2,995,651.94
පරිගණක	2,759,956.43	394,313.37	-	3,154,269.80
පරිගණක මෘදුකාංග	35,661,212.18	426,053.54	-	36,087,265.72
ගෘහ භාණ්ඩ කිරීම්	2,941,869.22	521,694.38	-	3,463,563.60
බෝට්ටු අවිවූ	11,611,491.63	4,882,639.28	-	16,494,130.01
ට්‍රැක්ටර් හා ට්ලර්	2,956,695.56	-	-	2,956,695.56
මෝටර් රථ	12,508,071.66	107,410.27	-	12,615,481.93
කල්බදු දේපළ				
මෝටර් රථ	4,934,561.36	1,702,716.00	-	6,637,277.36
ට්‍රැක්ටර් හා ට්ලර්	1,299,999.96	-	-	1,299,999.96
වෙනත් වත්කම්				
පරිගණක මෘදුකාංග	3,932,564.21	2,028,340.79	-	5,960,905.00
	95,852,239.91	**12,888,192.30**	**(2,171,.29)**	**108,738,260.95**
ශුද්ධ පොත් අගය	**306,722,462.53**			**294,930,251.53**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

2018 දෙසැම්බර් 31 වන දිනට	2018 (රුපියල්)	2017 (රුපියල්)
සටහන 13 – පරිලේඛන		
අමු ද්‍රව්‍ය	11,938,384.40	15,981,901.09
නොනිමි වැඩ	44,296,992.56	85,855,038.72
නිමි භාණ්ඩ හා මුහුදු යාත්‍රා	9,686,289.69	107,594.96
නිමි භාන්ඩ හා ධීවර උපකරණ	10,731,731.70	8,931,512.75
	76,653,398.35	**110,876,047.52**
සටහන 14 – වෙළඳ කටයුතු වලින් ලැබීම්		
වෙළඳ ණය ගැතියෝ	21,823,938.60	11,311,562.76
අඩුකලා බොල් ණය වෙන් කිරීම	(6,392,490.12)	(6,392,490.12)
	15,431,448.48	**4,919,072.64**
සටහන 15 - සේවක මණ්ඩලයේ ණය ගැතියෝ		
වැටුප් අත්තිකාරම්	6,446.89	-
උත්සව අත්තිකාරම්	61,628.59	165,901.20
සේවක මණ්ඩල ණය ගැතියෝ	11,645,464.94	10,101,063.61
	11,713,540.42	**10,266,964.81**
සටහන 16 - අනෙකුත් අයවිය යුතු ලැබීම්		
අමු ද්‍රව්‍ය සඳහා අත්තිකාරම්	115,463.35	115,463.35
වෙනත් අත්තිකාරම්	11,179,064.44	12,685,803.80
ලැබිය යුතු අනෙකුත් ලැබීම්	2,006,584.39	2,056,584.39
පෙර ගෙවුම් ආරක්ෂක සේවා බද්ද	2,466,894.26	2,466,894.26
උප කොන්ත්‍රාත්	4,909,775.05	4,909,775.05
ආපසු ලබා ගත යුතු තැන්පත්	770,402.76	584,112.76
දික්ඕවිට ව්‍යාපාරය ඉදිකිරීම්	1,770,766.18	1,770,766.18
දික්ඕවිට රඳවා ගැනීම් - LS	1,757,057.50	1,757,057.50
රඳවා ගැනීමේ බද්ද	2,485,142.02	1,119,029.73
සීනෝර් අවන්හලෙන් ලැබිය යුතු මුදල්	323,515.96	1,025,796.51
නඩු වලින් අපේක්ෂා කිරීම්	14,902.63	14,902.63
බැංකු ඇපවීම්	6,804,284.62	5,804,284.62
	34,603,853.16	**34,310,470.78**

සටහන 17 - මුදල් සහ බැංකු

ලංකා බැංකුව 1450	26,192,114.99	7,846,570.53
මහජන බැංකුව රැජින වීදිය 033 100 14 1790965	134,214.23	463,235.93
හැටන් නැෂනල් බැංකුව 16031	2,388,767.56	645,352.29
හැටන් නැෂනල් බැංකුව 10002143	26,823.58	26,823.58
පෑන් ඒෂියා බැංකුව 1356670117	2,941.80	2,941.80
ලංකා බැංකුව 72322913	16,915,987.32	21,192,032.41
සුළු මුදල් අග්‍රිමය	142,000.00	152,000.00
ඉන්ධන අග්‍රිමය	55,000.00	55,000.00
	45,857,849.48	**30,383,956.54**

ජංගම නොවන වගකීම්

සටහන 18 - අමාත්‍යාංශ ප්‍රධාන

බෝට්ටු අව්වු අත්තිකාරම් අඩි 55	20,000,000.00	20,000,000.00
අඩුකලා අවිනිශ්චිත - අඩි 55 අව්වු	(17,921,607.60)	(17,921,607.60)
	2,078,392.40	**2,078,392.40**

සටහන 19 - අනෙකුත් විලම්භීත නොවන බැරකම්

වර්ෂය ආරම්භයේ ශේෂය	14,094,316.50	12,601,054.00
එකතු කලා වර්ෂයට වෙන් කිරීම්		
පාරිතෝෂික - සෘජු	2,206,321.00	1,133,965.50
පාරිතෝෂික - පරිපාලන	840,978.50	2,041,731.00
	17,141,616.00	**15,776,750.50**
අඩුකලා වර්ෂය තුල ගෙවීම්	(1,390,705.00)	(1,682,434.00)
පාරිතෝෂික වෙන් කිරීම්	15,750,911.00	14,094,316.50
විලම්භීත ආදායම	17,226,909.98	23,559,826.78
	32,977,820.98	**37,654,143.28**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට	2018 (රුපියල්)	2017 (රුපියල්)
සටහන 20 - ණයට ගැනීම්වල පොලී		
කල්බදු ණය හිමියෝ	-	1,418,932.16
අඩුකලා අවිනිශ්චිත පොලී	-	62,209.32
	-	**1,356,722.84**
ජංගම වගකීම්		
සටහන 21 - කලුබදු ණය හිමියෝ		
කල්බදු ණය හිමියෝ	1,418,932.15	1,702,716.00
අඩුකලා අවිනිශ්චිත පොලී	62,209.32	214,920.69
	1,356,722.83	**1,487,795.31**
සටහන 22 - වෙළඳ ණය හිමියෝ	39,681,128.30	53,117,106.75
	39,681,128.30	**53,117,106.75**
සටහන 23 - අනෙකුත් ගෙවිය යුතු දෑ		
සේවක අර්ථසාධක අරමුදල් 20%	494,819.22	527,112.39
සේවක භාරකාර අරමුදල් 3%	74,222.84	79,066.86
භාණ්ඩ හා සේවා මත බදු	650,625.86	650,625.86
තැන්පතු	40,531,516.95	14,399,516.95
මුද්දර බද්ද	6,750.00	8,350.00
ජාතික ආරක්ෂක බදු	1,691,290.75	1,691,290.75
ආරක්ෂක සේවා ගාස්තු - CFHC	1,144,306.45	1,144,306.45
රඳවාගැනීම් බදු	3,368,451.75	3,368,451.75
විකුණුම් බද්ද	243,597.89	243,597.89
එකතු අගය මත බදු/ රඳවාගැනීමේ බදු	1,458,292.91	1,458,292.91
එකතු අගය මත බදු	(17,585,187.84)	(7,429,048.33)
ජාතිය ගොඩනැගීමේ බදු	10,437,306.46	10,791,948.88

ESC	(866,788.47)	424,105.00
බැංකු ණය	69,965.64	17,119.32
වෙළඳ අත්තිකාරම්	27,688,325.31	27,688,325.31
රඳවා ගැනීමේ ගිණුම	3,239,368.30	3,690,068.30
සුභ සාධක සමිතිය	337,682.83	52,325.32
වෘත්තීය සමිති ගිණුම	6,250.00	50.00
වන්දි ගිණුම - යාපනය	118,569.63	118,569.63
ණයවර ලිපි ගාස්තු	(2,786,334.17)	(976,726.35)
වැටුප් පාලක ගිණුම	226,264.57	218,725.29
හිමිකම් නොපෑ - වැටුප් හා වේතන	256,329.91	222,983.82
හිමිකම් නොපෑ - පාරිතෝෂික	412,620.00	412,620.00
ගෙවීම් ලබන්නන්ගේ ගිණුම	19,930.00	8,315.00
අනෙකුත් ණය හිමියෝ	68,479.68	68,479.68
විගණකයන්ගේ දීමනා	440,000.00	330,000.00
	71,746,656.47	**59,208,472.68**

<u>සටහන 24 - ගෙවිය යුතු ආදායම් බදු</u>

ජනවාරි 1 දිනට ශේෂය	674,993.66	7,115,837.60
අඩුකලා වසර තුළ ගෙවීම්	(674,994.66)	(7,115,837.14)
වර්ෂයේ ආදායම් බද්ද	4,835,327.00	3,332,771.00
	4,835,326.00	**3,332,771.46**
<u>අඩුකලා - බදු බැර</u>		
<u>සටහන 24. 1 - විලම්භිත බදු වගකීම්</u>	(4,254,033.00)	-
WHT ගෙවූ	-	(745,325.00)
ESC ගෙවූ		
2011/ 12	-	-
2012/ 13	-	-
2013/ 14	-	-
2014/15	-	-
2015/ 16	-	-
2016/17	-	(1,912,452.80)
ගෙවිය යුතු ආදායම් බදු	**581,293.00**	**674,993.66**

සටහන 25 - අඛණ්ඩ පැවැත්ම හෙළිදරව් කිරීම.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සියල්ලම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සඳහා අදාළ වන ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට අනුකූලව සකස් කර ඇත. සෑම වසරකම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී අඛණ්ඩව එම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර ඇති ඇගයීම් අනුව අපේක්සිත කළ හැකි අනාගත කාලයක් දක්වා ආයතනික කටයුතු කිසිදු බිඳවැටීමකින් තොරව පවත්වාගෙන යා හැකි බවට අපේක්ෂා කර ඇත.

සටහන 26 - රජයේ ප්‍රධාන

A. අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය වෙනුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වත්කමට අදාළ රජයේ ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගන්නා ලදී. මූල්‍ය වසරේදී වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ රු. 19,667,083.20 ක් හඳුනාගන්නා ලදී. මේ යටතේ 2016 වර්ෂයේදී රු. මී. 26 ක් ආදායම් ලෙස හඳුනාගෙන තිබූ අතර, එය 2018 වර්ෂයේදී නිවැරදි කරන ලදී. එම කාල වකවානුවේ ආදායමක් ලෙස පිළිනොගන්නා ලද රජයේ ප්‍රතිපාදන වලට අදාළ ඉතුරු මුදල විලම්භීත ආදායම් ලෙස පිළිගනු ලබන අතර වෙනත් විලම්භීත නොවන වගකීම් යටතේ රු. 17,226,909.98 ක මුදල ඉදිරිපත් කෙරේ.

සටහන 27 - අදාළ පාර්ශවයේ අනාවරණය කිරීම්

A. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට අනුබද්ධව ක්‍රියාත්මක වන සීමාසහිත සීනෝර් පදනම හට අමාත්‍යාංශය මගින් සහ එයට අනුබද්ධිත අනෙකුත් ආයතන වලින් ලබා දී ඇති ඇණවුම් මගින් රු. 109,934,138.31 ක මුදලක් 2018 වර්ෂය තුල උපයා ඇත.

B. සීමාසහිත සීනෝර් පදනමෙහි සභාපති ලෙස සේවය කරන පදනමෙහි ගණන්දීමේ නිලධාරියා එම අමාත්‍යාංශයට අනුබද්ධිත ධීවර සංස්ථාවෙහි සභාපති හා ජාතික ජලජීවී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරයි.

C. සීමාසහිත සීනෝර් පදනම 2008 වර්ෂයේ බන්ග්ලාදේශයේ පිහිටි ශ්‍රී බංග්ලාස් බෝට්ටු පුද්ගලික ආයතනය සමග රු. 1,961,850.00 ක ආයෝජනයක් සහිතව ආරම්භ කරන ලද බෝට්ටු සෑදීම ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සීනෝර් පදනමෙහි අධ්‍යක්ෂකවරයන් දෙදෙනෙකුගෙන්ද සමන්විත විය යුතු බව සඳහන් කර ඇත.

සටහන 28 - වෙන් කිරීම් සහ විලම්භීත බැරකම්

වර්ෂ 2018 තුළ දී සමාගම විසින් නිෂ්පාදනය කරන ලද ෆයිබර් බෝට්ටු සඳහා වගකීම් සහතික නිකුත් කිරීම සමාගමට විලම්භීත බැරකමකි. ආර්ථික වාසිය නැති වීම නිසා හෝ ජලය කාන්දු වීමේ ප්‍රවණතාවය නිසා හෝ මේ දක්වා වගකීම් සඳහා කිසිම ගණුදෙනුකරුවෙකු ඉල්ලුම් කර නැත.

සටහන 29 - ආයෝජන දේපළෙන් ලැබෙන ආදායම

සමාගම ආයෝජන ගණනය කිරීම සඳහා ආදර්ශ පිරිවැයක් යොදා ගන්නා ලදී. විශ්වාසනීයත්වය තීරණය කිරීමට සාධාරණ වටිනාකමකින් යුතු බදු ආදායමක් 2018 වර්ෂයට ලබා ගැනීමට ආයෝජන දේපළෙන් පහත දක්වා ඇති ක්‍රමයට ඇස්තමේන්තු කළ පිරිවැයක් යොදා ගන්නා ලදී.

ස්ථානය / අයිතමය	ගණන (රු)	කාලපරිච්ඡේදය
ජංගම වැඩහල්	1,005,882.36	ජනවාරි සිට දෙසැම්බර්
මට්ටක්කුලිය ඉඩම	12,000,000.00	ජනවාරි සිට දෙසැම්බර්
ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉඩම	810,000.00	ජනවාරි සිට දෙසැම්බර්
මත්තුමගල වැඩහල	2,700,000.00	ජනවාරි සිට දෙසැම්බර්
එකතුව	**16,515,882.36**	ජනවාරි සිට දෙසැම්බර්

සටහන 30 - සංචිත

සමාගම ස්වභාවයෙන්ම සුවිශේෂී නොවන සාමාන්‍ය ගණුදෙනු සිදු කරගෙන යන අතර එවිට එවැනි ගණුදෙනු වලින් ලැබෙන ලාභ හා අලාභ, වර්ෂයේ ආදායම් ප්‍රකාශ තුළ පෙන්වනු ලබයි. මෙසේ හඳුනාගන්නා ලාභ හා අලාභ වෙනුවෙන් වෙනම සංචිතයක් පවත්වා ගන්නා අතර ඒ මගින් කොටස් හිමියන්ට අදාළ බෙදාහැරීම් සිදු කරනු ලබයි.